

දේශපාලන ආයතන වල
කාන්තා නියෝජනය පිළිබඳ

# දකුණු ආසියානු රටවල
# අත්දැකීම්

කාන්තා දේශපාලන පීඨයේ ව්‍යාපෘතියකි.

අනුග්‍රහය:

යුරෝපා සංගමය

## දේශපාලන ආයතන වල
## කාන්තා නියෝජනය පිළිබඳ

# දකුණු ආසියානු රටවල
# අත්දැකීම්

**කාන්තා දේශපාලන පීඨයේ ව්‍යාපෘතියකි.**

අනුග්‍රහය:

**යුරෝපා සංගමය**

**IMADR**

**සියලු ආකාර වර්ගවාදයට සහ**
**ජාතිවාදයට එරෙහි ජාත්‍යන්තර සංවිධානය**

අංක 139 ඒ, ආනන්ද රාජකරුණා මාවත,
කොළඹ 10 - ශ්‍රී ලංකාව.

ග්‍රන්ථ නාමය:

**දේශපාලන ආයතන වල කාන්තා නියෝජනය පිළිබඳ**
**දකුණු ආසියානු අත්දැකීම්**

සංස්කරණය:

**නිමල්කා ප්‍රනාන්දු**

සම්පාදනය:

**බුද්ධිකා මෙන්ඩිස්**

විශේෂ සහය:

**ලීලා අයිසැක් සහ ෂාමිලා දළුවත්ත**

පිටු සැකැස්ම:

**සුපුන් ධනංජය**

01

# හැඳින්වීම

දකුණු ආසියාව යනු එයටම ආවේණික රටාවන් කැටි කරගත් දේශපාලන කලාපයකි. ලොව අන් කවර දෙසකටත් වඩා බලවත් කාන්තා දේශපාලනඥයන් මේ කලාපය තුළ අපට හමුවේ. මේ කලාපයේ රටවල් තුළින් රාජ්‍ය නායිකාවන්ද, අග්‍රාමාත්‍යවරියන්ද, ප්‍රධාන පෙළේ දේශපාලන පක්ෂ නායිකාවන්ද, ප්‍රාදේශීය දේශපාලන සංස්ථා වල නායිකාවන් ද අපට නිතැතින්ම හමුවේ. එහිලා නිදසුන් අවශ්‍ය නම් ශ්‍රී ලංකාවේ චන්ද්‍රිකා කුමාරතුංග, ඉන්දියාවේ සෝනියා ගාන්ධි, පාකිස්තානයේ බෙනාසීර් බූතෝ, බංග්ලාදේශයේ කලීඩා ශියා මෙන්ම ඉන්දියාවේ ප්‍රාන්ත දේශපාලනය තුළ අතිශයින්ම බලවත් මායාවතී, ජයලලිතා සහ උමා භාරතී වැන්නන්ගේ නම් සඳහන් කළ හැක. මේ තත්ත්වය මෙසේ වුවද ඉහත කී රටවල් තුළ කාන්තා දේශපාලනය සමස්තයක් ලෙස ගෙන බැලීමේදී අපට දක්නට ලැබෙන්නේ එතරම් ප්‍රිය උපදවන කතාවක් නම් නොවේය. පසුගිය දශක කිහිපය පුරාවටම මේ ඒ එරටවල ජාතික ව්‍යවස්ථාදායක සභාවන්හි කාන්තා නියෝජනය 6 -8% ප්‍රමාණය ඉක්මවා නොගිය බව දැකිය හැකිය. ජාතික තලයේ දේශපාලනය තුළ කාන්තාවන් කිහිප දෙනෙකු විසින් පතුරුවාගෙන තිබෙන ආධිපත්‍ය ඉහළ මධ්‍යම පන්තියේම සෙසු ස්ථරයන් වෙත හෝ සමාන්‍යයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පත්ව එන්නාවූ සෙසු සමාජ ස්ථරයන් සොයා හෝ සොයා බිඳකින්වත් ගමන් කර ඇති බවක් පෙනෙන්නට නැත. මෑතක් වන තුරුම ග්‍රාමීය මට්ටමේ දේශපාලනය තුළ කාන්තා දායකත්වයක් පැහැදිලි ලෙස විද්‍යාමාන නොවීය. කාන්තාවන් සිය ගෙදර දොර වගකීම් ඉෂ්ට කරමින්

එයටම සිරවී සිටිනා අතරතුර පිරිමි පාර්ශවය ප්‍රාදේශීය මට්ටමේ දේශපාලනය හැසිරවීය. කාන්තාවන්ගේ දෛනික කාර්යයන් සම්බන්ධයෙන් ප්‍රබල වශයෙන් බලපාන්නා වූ ගෘහස්ථ ජල සැපයුම ආදී කරුණු පිළිබඳ දේශපාලන කාරණාවලදී පවා කාන්තාවන්ගේ මතය අදාළ කරගත්තේ ඉතාමත්ම කලාතුරකිනි.

සිය රටවල කාන්තා දේශපාලන දායකත්වයේ දුර්වලතාවය ඉවත් කරන්නට දකුණු ආසියාවේ ඒ ඒ රටවල් විසින් මේ වනවිටත් පියවර ගෙන තිබේ. එහිලා ගනු ලැබ ඇති ප්‍රධානතම පියවරක් නම් ඒ ඒ මැතිවරණ කොට්ඨාශ තුළ කාන්තාවන් සඳහා වන ප්‍රමාණවත් කෝටාවක් වෙන් කිරීමයි. මේ පියවරම සුවිශේෂී අවධානයක් දැක්විය යුතු කුල සහ ගෝත්‍රයන්ගේ නියෝජනය සහතික කරනු වස්ද අනුගමනය කර ඇති ආකාරය දැක ගත හැක. ඉන්දියාව සහ බංග්ලාදේශයේ 1993 සිට ද 2000 වසරේ සිට පාකිස්තානයේද ප්‍රාදේශීය දේශපාලන ආයතන තුළ අවම වශයෙන් සමස්ත මන්ත්‍රී ආසන ප්‍රමාණයෙන් 30% ක හෝ කෝටාවක් කාන්තාවන් වෙනුවෙන් වෙන් කර තිබෙනු දැකිය හැකිය. ඉන්දීය ජාතික ව්‍යවස්ථාදායකයේ සෑම මන්ත්‍රී ආසන තුනකින් එකක් කාන්තාවන් වෙනුවෙන් වෙන් කිරීම සඳහා වන පනතක් පසුගිය වසර කිහිපය මුළුල්ලේම ඉන්දීය පාර්ලිමේන්තුව හමුවේ විවාදයට ලක් වෙමින් තිබේ. එරට පාර්ලිමේන්තුව නියෝජනය කරන ප්‍රධාන පෙළේ පක්ෂ සියල්ලක්ම පාහේ මේ පනත සම්මත කර ගැනීමට කැමැත්ත පළ කර ඇති මුත් තවදුරටත් ඒ පිළිබඳ විවාද කෙරෙමින් පවතී. මෙයට අමතරව විශේෂයෙන් ඉන්දියාව වැනි රටවල රාජ්‍ය නොවන සංවිධාන සහ අනෙකුත් කාන්තා ක්‍රියාකාරිකයන්ගේ බලපෑම හේතුවෙන් ස්වභාවික සම්පත් නඩත්තු කිරීම සඳහා වන ප්‍රජාමූල කණ්ඩායම් වැනි පරිපාලන ඒකක තුළට කාන්තාවන් වැඩි වැඩියෙන් අන්තර්ගත කරගනු දැකිය හැකිය. කෙසේ නමුත් තවමත් මේ කිසිම ක්‍රියාමාර්ගයක් කාන්තාවන්ගේ දේශපාලන දායකත්වය ප්‍රමාණවත් පරිදි වැඩි

කරන්නට සමත්ව නැති අතර ඇතැම් අවස්ථාවලදි කාන්තාවන් සඳහා නියෝජනයේ කෝටාවක් වෙන් කර දීම තවමත් විවාද මට්ටමින් ඔබ්බට ගොස් නැත.

ඉන්දියාව, පාකිස්තානය, බංග්ලාදේශය, නේපාලය සහ ශ්‍රී ලංකාව යනදකුණු ආසියානු රටවල කාන්තාවන්ගේ දේශපාලන සහභාගීත්වය පිළිබඳ විමර්ශනයක් සිදු කිරීම මෙම අධ්‍යනයේ අරමුණයි. ඒ යටතේ ප්‍රථමයෙන් කාන්තාවන් දේශපාලනයට සහභාගීවීමට එරෙහිව ක්‍රියාත්මක වන බාධක හඳුනා ගැනීමටත්, ප්‍රජා පරිපාලක කටයුතු විෂයෙහි කාන්තාවන්ගේ භූමිකාව හඳුනා ගැනීමටත්, ප්‍රාදේශීය සහ ජාතික තලයේ දේශපාලනය තුළ කාන්තා ක්‍රියාකාරීත්වය විමසා බැලීමටත් යොමුවන අතර ඉන් අනතුරුව අදාළ තත්ත්වයන් ගුණාත්මක ලෙස සංවර්ධනය කිරීම සඳහා යෝජනා කිහිපයක් ගෙන එනු ලැබේ.

02

# කාන්තා දේශපාලන සහභාගීත්වය විෂයෙහි ඇති බාධක

මේ කලාපයේ රටවල සමාජයීය සහ සංස්කෘතික වටපිටාවයන කරුණෙට වඩා අන් කිසිඳු යමක් කාන්තාවන්ගේ දේශපාලන සහභාගීත්වය සම්බන්ධයෙන් බාධාකාරී නැත. ඉහත කී බොහෝ රටවල් අතිශයින්ම පීතෘ මූලික සමාජයන්ගෙන් ගොඩ නැගුණු ඒවායි.

කාන්තාවන්ගේ දේශපාලන සහභාගීත්වයට බාධා පමුණුවන තවත් පැහැදිලි ලක්ෂණයක් නම් මේ කලාපෙයේ රටවල දේශපාලනයේ ඇති දැඩි තරඟකාරී ස්වභාවයයි. දකුණු ආසියානු රටවල දේශපාලනය "මහජන සේවය" යන නමින් සිදු කරන වෘත්තියක ස්වභාවය ගනී. මේ වෘත්තිය ආර්ථික සහ සමාජ බලය අතින් ගත් කළ අතිශයින්ම ඉහළ මට්ටමේ ප්‍රතිලාභ දෙන දෙන වෘත්තියකි. මැතිවරණයකින් ජයග්‍රහණය කර දේශපාලන ආයතනයක නියෝජිතයෙකු ලෙස පත්වීමට මහා ධන කන්දරාවක් වියදම් කිරීම අවශ්‍ය වන අතර ජයග්‍රහණයෙන් පසු වියදම් කළ මුදල මෙන් කිහිප ගුණයක් පහසුවෙන්ම උපයා ගත හැක. ඒ නිසාවෙන් ස්වභාවයෙන්ම පිරිමින් මේ ධන උල්පතට කාන්තාවන් සම්බන්ධ කර ගන්නට පසුබට වෙති. බොහෝ විට මේ විරෝධය සිය පවුල තුළින්ම මතුව එන්නක් බැවින් කාන්තාවන්ට එවැනි බාධක මග හැර දේශපාලනයට පිවිසීම කිසිසේත් පහසු නැත. මෙහිලා ඉස්මතු වන අනෙක් බාධකය නම්, මේ රටවල දේශපාලනය ස්වභාවයෙන්ම ප්‍රචණ්ඩත්වය සමග බැඳී තිබීමයි. ඡන්ද මධ්‍යස්ථානවලට බලෙන් කඩා වැදීමේ

සිට විරුද්ධ දේශපාලකයන් අතුරුදහන් කර දැමීම දක්වා දරුණු ක්‍රියා මේ යටතේ සිදුවිය හැක. ඉන්දියාවේ පක්ෂ කිහිපයකින්ම මහජන නියෝජිතයන් ලෙස තේරී පත්ව සිටින මහජන නියෝජිතයන් විශාල සංඛ්‍යාවකට අපරාධ චෝදනාවන් එල්ල වීඇත. එවැනි වාතාවරණයක් තුළ දේශපාලනයට පිවිසීම යනු කාන්තාවන් දැඩි අන්තරාදායක තත්ත්වයකට මුහුණ දීමකි.

මෙකී බාධාකාරී තත්ත්වය හේතුවෙන් කාන්තාවන් සම්බන්ධයෙන් තරමක හෝ හිතකර තත්ත්වයක් ක්‍රියාත්මක ශ්‍රී ලංකාව වැනි රටවල පවා දේශපාලනය තුළ කාන්තා සහභාගීත්වය පවතින්නේ අතිශයින්ම අවම මට්ටමකය.

03

# ප්‍රාදේශීය ස්ව-පාලන ඒකක

සම්ප්‍රදායක් ලෙස සෑම පොදු ස්ථානයක්ම පාහේ පිරිමින්ගේ ඒකාධිකාරියට යටත්ව ක්‍රියාත්මක වන්නාක් මෙන්ම ග්‍රාමීය පාලන යාන්ත්‍රණයන්ද පිරිමින් මූලිකව පවත්වාගෙන ගිය ආයතන විය. ඉන්දියාවේ දැනට ක්‍රියාත්මක වන පංචායත් සභාවන් වැනි පරිපාලන ඒකක අතීතයේදී කුල ක්‍රමය පදනම්ව ගොඩනැගුණු අතර සෑමවිටම පිරිමින් විසින් ඒවායේ ප්‍රධානත්වය දරන ලදි. කාන්තාවන්ට බලපාන ගැටලු පිළිබඳ මෙම ආයතනයන් තුළ බොහෝ විට කතාබහ වූ නමුත් කාන්තාවන්ට කිසිසේත්ම මෙම ආයතන තුළ සාමාජිකත්වයක් හිමි නොවිණි. ගාන්ධි ව්‍යාපාරය වැනි දේශපාලන ව්‍යාපාරයන් හරහා ඉහත කී ප්‍රාදේශීය පාලන ඒකක වඩාත් ශක්තිමත්ව ක්‍රියාත්මක වූ අතර සෙසු දේශපාලන ව්‍යාපාරයන්ගේ විරෝධතාවය මධ්‍යයේ වුව ගාන්ධි ව්‍යාපාරය විසින් මෙම ප්‍රාදේශීය පාලන ඒකක වඩ වඩාත් ධෛර්යමත් කරන ලදි. ඉන්දියාව සහ පාකිස්තානය බ්‍රිතාන්‍ය පාලනයෙන් නිදහස ලැබීමෙන් පසු මේ ප්‍රාදේශීය ස්ව-පාලන ඒකක 'පංචායත් සභා' යන නිල නාමයෙන් හැඳින්වීම ආරම්භ වූ අතර ගම්වාසීන් අතරින් මෙකී සභාවන්ට තෝරා පත්කර ගත් නියෝජිතයන්ට 'පංචායත්වරුන්' යන නාමය භාවිතා වීම ද ඒ සමග ඇරඹිනි. ප්‍රජාවේ පරිපාලන කටයුතු මෙහෙයවීම එකී ප්‍රජාවේ වැසියන්ටම භාර දීම හරහා විශේෂ ප්‍රජා සංවර්ධනයක් ඇති කිරීම පංචායත් ක්‍රමයේ මූලිකම අරමුණක් විය. කෙසේ වුවත් ඉන් සිදු වූයේ ඉන්දියානු සංස්කෘතියේ ඇති අන් සියලු විවිධත්වයන් නොසලකා හරිමින් ප්‍රාදේශීය මට්ටමින් ප්‍රජාවන් සංවර්ධනය කිරීමට අවධානය යොමු කිරීමක් පමණි.

තවත් කලකට පසුව පංචායත් සභා තුළට අතිශයින්ම සුළු කාන්තා නියෝජනයක් අන්තර්ගත විය. ඒ ඒ ගමෙන් තෝරාගත් අතලොස්සක් කාන්තාවන් නියෝජිතයන් ලෙස පංචායත් සභාවන්ට සහභාගී කරවිණි. කෙසේ නමුත් පංචායත් සභා තුළ ඔවුන්ගේ කාර්යභාරය අතිශයින්ම සාමාන්‍ය සහ උදාසීනවිය. බොහෝ කාන්තා නියෝජිතයන් තුළ පංචායත් සභාවන්ට සහභාගී වීමට දැඩි උනන්දුවක් නොතිබුණු අතර සහභාගී වූවද ඔවුන් විසින් බොහෝ විට කළ කාර්යය වූයේ පිරිමි පාර්ශවය විසින් ගනු ලබන තීන්දු තීරණ තර්කයකින් තොරවම අනුමත කිරීම පමණකි. බොහෝ විට මේ සභාවන් තුළ කාන්තා නියෝජනය හුදු සංකේතාත්මක එකක් පමණක් වූ අතර ඇතැම් අවස්ථාවල එතරම්ම හෝ වටිනාකමක් කාන්තා නියෝජිතවරියන්ට හිමි නොවිණි.

ඉන්දියාව තුළ මේ තත්ත්වයට පැහැදිලි වෙනසක් අත් වූයේ 1980 දී ඉන්දීය කාන්තා දේශපාලපාලනයේ උච්චතම අවස්ථාවක් සනිටුහන් වීමෙන් පසුවය. අන් ලෙසකින් කියන්නේ නම් ඉන්දියාවේ අගමැතිනිය වශයෙන් ඉන්දිරා ගාන්ධි මහත්මිය අතිශයින්ම සාර්ථක ගමනක් ඇරඹීමේ ප්‍රතිඵලයක් ලෙසය. සිය පාලන කාලය තුළ වූ නොයෙක් ආකාරයේ දේශපාලන ආරවුල් සහ හදිසි අවස්ථාවන්ට නිර්භයව හා සාර්ථකව මුහුණ දීම තුළින් තමන් කොතරම් ශක්තිමත් නායිකාවක්ද යන වග ඇය විසින් පෙන්වූ දුන්නීය. 'සමානාත්මතාවය වෙනුවෙන්' යන නමින් යුතුව 1974 දී නිකුත් කරන ලද කාන්තාවන් පිළිබඳ ඉන්දීය කොමිෂමේ වාර්තාවෙන් දේශපාලනය තුළ කාන්තාවගේ තත්ත්වය කෙරෙහිත් පංචායත් සභා තුළ පැහැදිලි නිශ්චිත කෝටාවක් කාන්තා නියෝජනය සඳහා වෙන් කිරීම කෙරෙහිත් අවධානය යොමු කරන ලදි. මේ පසුබිම තුළ කාන්තාවන්ගේ දේශපාලන අභිලාෂයන් වඩාත් ශක්තිමත්ව ඉහළ නැංවිණි. එතරම් ජනාකීර්ණ නොවන ගම්මාන මූලික කරගෙන ක්‍රියාත්මක වූ පංචායත් සභාවන් නියෝජනය කිරීමට කාන්තාවන්

උත්සාහ කිරීමේ අවස්ථාවන් පිළිබඳ උදාහරණයක් හෝ දෙකක් ඉන් පෙරද වාර්තාවී තිබිණි. 1975 වසරේ එක් අවස්ථාවක මහරාශ්ට්‍ර ප්‍රාන්තයේ පූනේ දිස්ත්‍රික්කයේ කාන්තාවන් විශාල කාන්තා හමුවක් පැවැත්වූ අතර ඉන් අනතුරුව සිය ප්‍රදේශයන්හී තරුණ ප්‍රජාව සමග එක්ව පංචායත් සභා මැතිවරණයකට තරඟකරන්නටද මේ කාන්තාවන් කටයුතු කළහ. එවැනි ආකාරයේ අභියෝගයන් ඉන් වසර 10 කට පසු වඩ වඩාත් පුළුල් ලෙස නැග එන්නට විය. 1985 දී බටහිර ඉන්දියාවේ ඉන්දෝලි ගම්මානයේ පංචායත් සභාවට කාන්තාවන්ගෙන් පමණක් සමන්විත කණ්ඩායමක් ද තරඟ වැදිණි. ගම්මානයේ සාම්ප්‍රදායික දේශපාලන ප්‍රබලයන්ගේ නොයෙක් ආකාර තර්ජනයන් මේ කාන්තාවන්ට එල්ල වූ අතර වරක් මේ කාන්තාවන්ගේ ස්වාමිපුරුෂයන්ට අපහාස කොට තිබුණේ සිය බිරුන්දෑවරුන්ගෙන් වළළු ඉල්ලාගෙන පැළඳ ගන්නා ලෙස කියමිනි. අවසානයේ මැතිවරණනයෙන් මේ කාන්තා කණ්ඩායමට හිමි වූයේද දරුණු පරාජයක් පමණක්මය. තවත් වරෙක පිරිමින්ගේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක වූ එක්තරා කණ්ඩායමක් ගම්මානයේ සමූපකාර සංගමයේ කළමණාකරණ කටයුතු හැසිරවීම සඳහා සම්පූර්ණයෙන්ම කාන්තාවන්ගෙන් සැදුම්ලත් කණ්ඩායමක් පත් කරගන්නා ලදි. එහෙත් පසුව අනාවරණය වූයේ ඉහත කී පිරිමි පුද්ගලයන් විසින් මේ කාන්තාවන්ට මුවාවී විවිධ වංචා දූෂණයන් සිදු කිරීම හැර එහිලා අන් අරමුණක් නොවූ බවය.

තවත් වරක් මහරාශ්ට්‍ර ප්‍රාන්තයේ 'ශෙත්කාරි සංගාතන' නම් ගොවි සංවිධානයක් විසින් දිස්ත්‍රික් මැතිවරණයක් සඳහා මුළුමනින්ම කාන්තාවන්ගෙන් සැදුම්ලත් කණ්ඩායමක් ඉදිරිපත් කිරීමට සැලසුම් කරන ලදි. ඒ අනුව සෙසු පක්ෂද අකැමැත්තෙන්වුව කාන්තා අපේක්ෂකයන් වඩ වඩාත් නාමයෝජනා කරන ලද අතර මැතිවරණයට තරඟ වැදීම සඳහා කාන්තාවන් තුළද ප්‍රබල උනන්දුවක් දිස් විය. කෙසේ නමුත් එවකට ඉන්දීය මධ්‍යම

ආණ්ඩුව හෙබවූ කොන්ග්‍රස් පක්ෂය දේශපාලන සංකූලතා හේතුවෙන් දිගින් දිගටම මෙකී දිස්ත්‍රික් මැතිවරණය කල් දැමූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඉහත කී කාන්තා කණ්ඩායම්වල ක්‍රියාකාරීත්වය කෙමෙන් කෙමෙන් අඩාල වී ගියේය.

මේ සියල්ලෙහිම ප්‍රතිඵලයක් ලෙස කාන්තාවන් වඩ වඩාත් සිය දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ දැනුම්වත් වූ අතර පිරිමි පාර්ශවය විසින් කැමැත්තෙන් හෝ අන් කළ හැකි යමක් නොමැති නිසාවෙන් හෝ ලබාදුන් සහයෝගය මත ප්‍රාදේශීය මට්ටමේ දේශපාලනය තුළ සිය ශක්තිය වර්ධනය කරගන්නටද කාන්තාවන් සමත් විය. 1990 දශකයේ ආරම්භය වන විට ඉන්දියාව පුරා 10 කට අධික කාන්තා කණ්ඩායම් ප්‍රමාණයක් ප්‍රදේශීය දේශපාලන ආයතනවලට නියෝජිතයන් ලෙස තේරී පත්ව සිටිනු දැකිය හැකි විය. එකී කණ්ඩායම් අතුරින් බොහෝ ප්‍රමාණයක් පත්ව තිබුණේ පෙර කී ශෙත්කාරී සංගාතන සංවිධානය ප්‍රබල ලෙස ක්‍රියාත්මක වූ දිස්ත්‍රිකයන් තුළිනි. සැලකිය යුතු ප්‍රමාණයක් සෙසු සංවිධානවල බලය ක්‍රියාත්මක දිස්ත්‍රික්කවලින්ද පත්ව තිබිණි.මේ අතරතුර සිදුවූ වඩාත්ම වැදගත් දෙය වූයේ කාන්තාවන්ට දේශපාලන ආයතන තුළ සැලකිය යුතු නියෝජනයක් ලබා දීම තුළ වඩ වඩාත් පිරිසිදු පරිපාලනයක් පවත්වාගෙන යන්නට හැකිවෙනු ඇතැයි යන සිතුවිල්ල ඇතිවීමයි. මේ තත්ත්වය තුළ කාන්තාවන් කොතෙක් බාධාවන්ට මුහුණ දුන්නද ඒ සියල්ල මැඩ පවත්වා පෙරට වඩා බෙහෝ සෙයින් දියුණු දේශපාලන තත්ත්වයක් මෙන්ම කාන්තාවන් වශයෙන් විශේෂ සමාජ ගරුත්වයක්ද දිනා ගැනීමට සමත් විය. (ගලා, 1990, 1997). ඒ අනුව මුළුමනින්ම කාන්තාවන්ගෙන් සැදුම්ලත් පංචායත් සභාවන් පිළිබඳ ඉන්දියාවේ නොයෙක් දිස්ත්‍රික්කයන්ගෙන් වාර්තා වන්නට විය.

මෙවැනි පසුබිමක් තුළ 1993 දී ඉන්දීය ව්‍යවස්ථාවේ 73 වන සංශෝධනය යෝජනා සම්මත වේ. පංචායත් සභාවන් හරහා ග්‍රාමීය ජනතාවගේ සහයෝගය දිනා ගැනීමට ඇති හැකියාවේ තරම එවකට ඉන්දීය අග්‍රාමාත්‍ය රජීව් ගාන්ධි මහතා පැහැදිලිවම හඳුනා ගෙන තිබිණි. ඔහු කළේ කාන්තාවන්ගේ දේශපාලන අභිලාෂයන් සහ ප්‍රජා පාලනය විෂයෙහි පංචායත් සභාවන් තුළ තිබූ අභිලාෂයන් ඒකාබද්ධ වන පරිදි ව්‍යවස්ථා සංශෝධනය සකස් කිරීමයි. ඒ අනුව ඉහත කී ව්‍යවස්ථා සංශෝධනය හරහා පංචායත් සභාවන්හී ව්‍යූහය සම්පූර්ණ වෙනසකට ලක් කෙරුණු අතර පංචායත් සභාවෙහි නියෝජිතයන්ගෙන් තුනෙන් එකක් කාන්තාවන් විය යුතුය යනුවෙන් නීතිමය ප්‍රතිපාදනයක් ඒ තුළ අන්තර්ගත විය. ඒ අනුව ග්‍රාමීය, තලූකා පරිපාලන ඒකක (Taluka), අර්ධ නාගරික සහ නාගරික යන සියලුම මට්ටමේ පංචායත් සභා තුළ කාන්තා නියෝජිතයන්ට නිශ්චිත කෝටාවක් වෙන් වීම ආරම්භ විය. ප්‍රායෝගික මට්ටමේදී කාන්තාවන් තෝරා ගැනීම සඳහා අදාළ මැතිවරණ කලාපය තුළ විශේෂ ඡන්ද කොට්ඨශ වෙන් කෙරිණි. කාන්තා නියෝජිතයන් සඳහා වූ විශේෂ ඡන්ද කොට්ඨාශ සෑම මැතිවරණයක් පාසාම අලුතෙන් නිර්මාණය කෙරුණු අතර එහි අවසාන අරමුණ වූයේ එළැඹෙන වර්ෂ කිහිපය තුළ මිලියනය ඉක්මවන ඉන්දීය කාන්තාවන් ප්‍රමාණයක් ක්‍රියාකාරී දේශපාලනයට ගෙන ඒමයි (මීට අමතරව, මුළුමනින්ම කාන්තාවන්ගෙන් සැදුම්ලත් පංචායත් සභා තේරී පත්වීම වැලැක්මීමටද ඉහත කී ව්‍යවස්ථා සංශෝධනය ඉවහල් වූ බවද පැහැදිලිය. පෙර අවස්ථාවන්හීදී මුළුමනින්ම කාන්තාවන්ගෙන් සැදුම්ලත් පංචායත් සභා ඇති කිරීම සඳහා කටයුතු කළ ශෙත්කාරි සංගාතන වැනි සංවිධාන පවා කාන්තා නියෝජිතයන් සඳහා වෙන්වූ විශේෂ මැතිවරණ කොට්ඨාශ ක්‍රමයට මුළුමනින්ම එකඟවිය). ප්‍රාදේශීය දේශපාලන ආයතන තුළ කාන්තාවන් සඳහා සාධාරණ නියෝජනයක් ලබා දීම එපරිද්දෙන් ආරම්භ විය.

ප්‍රාදේශීය දේශපාලන අධිකාරීන් තුළ කාන්තා නියෝජිතයන් සඳහා විශේෂ කෝටා ක්‍රමයක් බංග්ලාදේශය තුළද ක්‍රියාත්මක වේ. කාන්තාවන් සඳහා වන මෙකී විශේෂ කෝටාව සහතික කොට තිබෙන්නේ පාකිස්ථානයෙන් වෙන්වීමෙන් පසු ඇති කරගත් නිදහස් බංග්ලාදේශ ව්‍යවස්ථාවේ එන එක් මූලික ව්‍යවස්ථා මූලධර්මයක් ලෙසය. 1993 දී ඉන්දියාව තුළ සිදු කළ ව්‍යවස්ථා සංශෝධනය අනුගමනය කළ බංග්ලාදේශ පාර්ලිමේන්තුව විශේෂ පනතක් හරහා පරිෂාද් (Parishad) නමින් හැඳින්වෙන එරට නාගරික පරිපාලන සභාවන් තුළ විශේෂ කාන්තා නියෝජන ක්‍රමය ආරම්භ කළහ. මෙම පනත සම්මත කිරීමෙන් පසුව පැවති ප්‍රථම මැතිවරණය 1997 දී පැවැත්ණි. ("Global Database, 2004"). මැතිවරණයේ ප්‍රතිඵලයක් වශයෙන් බංග්ලාදේශ කාන්තා ක්‍රියාකාරිකයන් 12,000 ක් පමණ එරට ප්‍රාදේශීය දේශපාලනයට සම්බන්ධ විය.

පාකිස්ථානය තුළ 2000 වර්ෂයේ මාර්තු මාසය තුළ සම්මත කර ගත් බලතල බෙදා හැරීමේ සැලසුම හෙවත් පළාත් පාලන අයාතන සැලසුම ප්‍රකාරව යූනියන් ඒකක (Union), ටෙහ්සිල් පරිපාලන ඒකක (Tehsil), නාගරික පරිපාලන ඒකක සහ දිස්ත්‍රික් සභා යන ඒ ඒ පළාත් පාලන ආයතනවල මන්ත්‍රී ආසන ප්‍රමාණයෙන් 33% ක ප්‍රමාණයක් කාන්තාවන් වෙනුවෙන් වෙන් කර ඇත. පාකිස්ථාන මැතිවරණ ක්‍රියාවලිය තුළ ටෙහ්සිල් පරිපාලන ඒකක සහ දිස්ත්‍රික් පරිපාලන ඒකකයන්ට නියෝජිතයන් තෝරා පත් කර ගන්නේ ඍජු මැතිවරණ ක්‍රියාවලියක් හරහා නොවේය. එකී ආයතන දෙක සඳහා නියෝජිතයන් තෝරා පත් කෙරෙන්නේ ඒ ඒ ටෙහ්සිල් සහ දිස්ත්‍රික් පරිපාලන ඒකකයන් අයත් වන යූනියන් ඒකක වලට තේරී පත්ව සිටින නියෝජිතයන්ගෙන් සැදුම්ලත් ඡන්ද විද්‍යාලයක් හරහාය. කෙසේ නමුත් පාකිස්ථානය තුළ කාන්තා දේශපාලන ක්‍රියාකාරීත්වයෙහි පැහැදිලි ප්‍රගමනයක් දැකිය හැකිය. මේ කලාපයේ සෙසු කවරම හෝ රටක පාර්ලිමේන්තුවකට වඩා වැඩි කාන්තා නියෝජිතවරියන් ප්‍රමාණයක්

පාකිස්ථාන පාර්ලිමේන්තුවට තේරී පත්ව සිටියි. ඒ හා සමගාමීව පළාත් පාලන ආයතන තුළ කටයුතු කරන කාන්තා නියෝජිතවරියන්ද ප්‍රමාණයෙන් සෙසු රටවලට වඩා වැඩි අගයක් ගනී. පසු කාලීනව ඇති කරන ලද නව යූනියන් ඒකකයන්හී ක්‍රියාකාරීත්වයද සමග දළ වශයෙන් 70,000 ක පමණ කාන්තා ක්‍රියාකාරිකයින් ප්‍රමාණයක් ප්‍රාදේශීය පාලන ඒකකවල කටයුතු කරනු ලබයි. (පළාත් පාලන ආයතන පිළිබඳ වාර්තාව : පාකිස්ථානය, 2000). මේ සංඛ්‍යා ලේඛන විසින් පෙන්වා දෙන කරුණු සැබැවින්ම වැදගත්ය, කෙසේ වුවද මෑතකදී යෝජනා වී ඇති ව්‍යවස්ථා සංශෝධනයක් හරහා යූනියන් ඒකක ප්‍රමාණය දැනට ඇති ප්‍රමාණයෙන් හරි අඩක් දක්වා අඩු කිරීමට සැලසුම් කර තිබීම තුළ ඉහත කී කාන්තා නියෝජනය යම් ආකාරයක තර්ජනයකට ලක්ව ඇත. ඒ නිසාම යෝජිත ව්‍යවස්ථා සංශෝධනය කාන්තා ක්‍රියාකාරී සංවිධානවල බලවත් ප්‍රතිරෝධයට පාත්‍ර වී ඇත (බාරි, 2005).

ශ්‍රී ලංකාව තුළ 1998 සහ 2000 යන වර්ෂ අතර තුර කාලය තුළ කාන්තා දේශපාලන නියෝජනය සඳහා කිසියම් ආකාරයක කෝටා ක්‍රමයක් ක්‍රියාත්මක විණි. කෙසේ නමුත් වර්තමානය වන විට එම කෝටා ක්‍රමය මුළුමනින්ම අහෝසි වීඇත. පළාත් පාලන ආයතනවල සමස්ත නියෝජනයෙන් 25% ක කෝටාවක් කාන්තාවන්ට ලබා දීමට ප්‍රතිපාදන සලසන ව්‍යවස්ථා සංශෝධනයක් 2000 වර්ෂයේදී යෝජනා වූ නමුත් එය පාර්ලිමේන්තුවේ විවාදයට නොගැනිණි. කාන්තා නියෝජනය සඳහා විශේෂ කෝටාවක් ඇති කිරීමට උත්සාහ කළ සෑම විටෙකම දෙමළ සහ මුස්ලිම් පදනමක් සහිත දේශපාලන පක්ෂ විසින් 'සුදුසු අපේක්ෂිකාවන් නොමැත' යන පැරණි නිදහසට කාරණයම ඉදිරියට දමමින් ඒ සඳහා විරුද්ධ වූහ. 2002 වර්ෂයේදී කාන්තා නියෝජිතවරියන් සඳහා විශේෂ කෝටාවක් සඳහා වන ඉල්ලීම ප්‍රබලව නැග ආයේය. එවකට කාන්තා කටයුතු පිළිබඳ ඇමතිනී හේමා රත්නායක මහත්මිය ප්‍රකාශ කර සිටියේ ජාතික ව්‍යවස්ථාදායකය වන

පාර්ලිමේන්තුවද ඇතුළත්ව සියලුම ආකාරයේ දේශපාලන සංස්ථාවන්තුළ 25% ක කෝටාවක් කාන්තාවන්ට සහතික කෙරෙන ව්‍යවස්ථා සංශෝධනයක් ගෙන ඒමට එවකට පැවති සන්ධාන ආණ්ඩුව කටයුතු කරමින් සිටින බවයි. කාන්තා දේශපාලන නියෝජනය සඳහා පැහැදිලි කෝටා ක්‍රමයක් නොමැති වීම හේතු කොටගෙන මේ කලාපයේ අවම ප්‍රාදේශීය කාන්තා දේශපාලනයක් දක්නට ලැබෙන්නේ ශ්‍රී ලංකාව තුළයි. ඒ අනුව පළාත් සභා තුළ 4% ක් ද නගර සභා තුළ 2.3% ක් ද ප්‍රාදේශීය සභා තුළ 1.4% ක් ද වශයෙන් කාන්තා දේශපාලන ක්‍රියාකාරීත්වය හඳුනා ගත හැක. (කාන්තා දේශපාලනය සඳහා වන ආසියා -පැසිෆික් මධ්‍යස්ථානය, 2001)

1999 දී සම්මත කරන ලද නේපාල පළාත් පාලන අයාතන පනතට අනුව එරට ප්‍රාදේශීය දේශපාලන ආයතන තුළ නියෝජනයෙන් 20% ක කෝටාවක් කාන්තාවන් සඳහා වෙන් කොට ඇත. ඒ අනුව නාගරික සභා සහ ග්‍රාමීය පරිපාලන ඒකක හරහා 40,000ක පමණ ක්‍රියාකාරී කාන්තාවන් ප්‍රමාණයක් දේශපාලනයට සෘජුවම සම්බන්ධව සිටියි. MUAN හෙවත් නේපාල නාගරික සභා සංගමය විසින් කාන්තා දේශපාලන ක්‍රියාකාරිකයන් සඳහා විශේෂ පුහුණු වැඩසටහන් ද ක්‍රියාත්මක කරයි.

04

# ග්‍රාමීය දේශපාලනය තුළ ක්‍රියාත්මක කෝටා ක්‍රමයේ ප්‍රතිඵල

ප්‍රාදේශීය දේශපාලන ආයතන තුළ කාන්තාවන් වෙනුවෙන් විශේෂ කෝටා ක්‍රමය ක්‍රියාත්මක වීම ආරම්භ වී ගතව ඇත්තේ දශක දෙකකට ද අඩු කාලයකි. ඒ නිසාවෙන් ඒ සම්බන්ධයෙන් මෙතෙක් සිදු කෙරී ඇත්තේ අධ්‍යනයන් සීමිත සංඛ්‍යාවක් පමණි. ඉන්දියාව තුළ කෝටා ක්‍රමයේ ආරම්භයේදී කාන්තාවන් යම් අපහසුතාවයකට පත් විය. එයට හේතු වූයේ දේශපාලනය සම්බන්ධයෙන් ඔවුන් තුළ වූ අඩු අත්දැකීම් ප්‍රමාණයත්, ප්‍රධාන වශයෙන් පිරිමි දේශපාලන ප්‍රබලයන් සමග කටයුතු කරන්නට වීමත්ය. ඒ තත්ත්වය තුළ බොහෝ කාන්තා නියෝජිතයන්ට තමන් බලෙන් දේශපාලනයට ඇද දැමූවාක් වැනි හැඟීමක් ඇතිව තිබිණි. (කාන්තා නියෝජිතවරියන් බහුතරයකගෙන් සමන්විත වූ හෝ මුළුමනින්ම කාන්තා නියෝජිතයන්ගෙන් සැදුම්ලත් පංචායත් සභාවන් තුළ තත්ත්වය වඩාත් සුබවාදී විය. එවැනි ආයතනවල කාන්තාවන්ටද විවිධ බාධාවන් එල්ල වුවද සෙසු සමාජ ක්‍රියාකාරිකයන්ගේ දායකත්වය මැද ඒවාට සාර්ථකව මුහුණ දීමටඑකී කාන්තා නියෝජිතයන්ට හැකි විය).

කාන්තා දේශපාලන ක්‍රියාකාරිනියන් සම්බන්ධයෙන් විවිධ පුහුණු වැඩසටහන් දිගින් දිගටම ක්‍රියාත්මක විය. කාන්තාවාදී ක්‍රියාකාරිකයන්ගේ මෙහෙයවීම මත රාජ්‍ය නොවන සංවිධාන ගණනාවක් මෙකී පුහුණු කිරීම් මෙහෙයවූ අතර ප්‍රාදේශීය පරිපාලනය විෂයෙහි බලපාන විවිධ කරුණු සහ මුහුණ දීමට සිදුවෙන ගැටලු පිළිබඳ මෙන්ම කාන්තා සමානාත්මතාවය පිළිබඳ ඇතැම් සරල සංකල්ප පිළිබඳවද දැනුවත් කිරීම්දඑ් යටතේ සිදුවිණි.

ඉන්දියාවේ යටත් විජිත යුගය තුළ බෙහෙවින්ම සෞභාග්‍යමත්ව තිබූ ඔරිස්සාවේ ගම්මාන දෙකක් තුළ විශේෂ අධ්‍යනයක් එව්ලින් හර්ස්ට් විසින් සිදු කරන ලදි. අධ්‍යනයට පාත්‍ර වූයේ එකිනෙකට වෙනස් ලක්ෂණ වලින් යුතු ගම් දෙකකි. ඉන් එකක් මුහුදුබඩ ගම්මානයක් වූ අතර අනෙක රට ඇතුළට වන්නට පිහිටියේ ය. කාන්තා නියෝජනය නිසාවෙන් සාපේක්ෂ වශයෙන් මහා පරිමාණ වෙනස් කම් සිදුව නොතිබුණද මේ ගම්මානවල කාන්තාවන් පැහැදිලි වෙනස්කම්වලට භාජනයවී ඇති බව හර්ට්ස් විසින් නිරීක්ෂණය කරන ලදි. නිදහසේ ගමන් යාම සම්බන්ධයෙන් මේ කාන්තාවන්ට අතීතයේදී දැඩි සේ සීමා පනවා තිබූ නමුත් ඒ වන විටඔවුන් කැමති ලෙස ගමන් බිමන් යාමටත් බාහිර පුද්ගලයන් සමග සම්බන්ධ වී කටයුතු කිරීමටත් ඉඩ ලබා ගෙන තිබිණි. වඩාත්ම වැදගත් වූයේ කාන්තාවන් තම තත්ත්වය පිළිබඳ වඩාත් සුබවාදීව කල්පනා කරන්නටත් ඉහළ ආත්ම විශ්වාසයකින් යුතුව කටයුතු කරන්නටත් පියවර ගෙන තිබීමයි. (හර්ට්ස්,2004 : 262 -5). දේශපාලන ගති ස්වභාවයන් සහ ගැටලු පිළිබඳ පිරිමින් තරම්ම අවබෝධයකින් කාන්තාවන් කටයුතු කරනු දකින්නට නොලැබුණු අතර ප්‍රාදේශීය පාලන ඒකක තුළ සිදුවූ වංචා දූෂණයන් කාන්තාවන්ගේ ආගමනය තුළ පැහැදිලි වෙනස්කමකට ලක් නොවූ බවත් නිරීක්ෂණය විය. කාන්තා නියෝජිතයන් තුළින් බොහෝ විට සිදු වූයේ පොදු සංවර්ධනය සම්බන්ධයෙන් පිරිමි නියෝජිතවරුන් කියා සිටි කාරණාම අඩු වැඩි වශයෙන් කියා සිටීමයි. නමුත් වඩාත්ම වැදගත් කරුණ ලෙස හර්ට්ස් විසින් මතු කර දැක්වූයේ දේශපාලනය තුළ කාන්තාවට හිමිවූ වටිනාකමෙහි පැහැදිලි වර්ධනය සහ තමන්ගේ දේශපාලන නියෝජිතයන් සමග කටයුතු කිරීමට ජනතාවට වැඩි වැඩියෙන් අවස්ථාවන් හිමිවීමයි. විවිධ දුක් ගැනවිලි සමග පිරිමි දේශපාලනඥයන් හමුවට යාමට වඩා කාන්තා දේශපාලනඥයන් හමුවට යාමට ලැබීම ජනතාවට විශේෂයෙන් කාන්තාවන්ට සහනයක් විය. භූගෝලීය වශයෙන් මෙම ගම්මාන දෙක අතර වූ වෙනස්කම් ද ඒ ඒ ගම්මානවල කාන්තා දේශපාලනය විෂයෙහි බලපා තිබිණි. ජාතික

ව්‍යාපාරයන්ට වඩාත් ක්‍රියාශීලී ලෙස දායක වූ වැසියන් පිරිසක් වාසය කළ මුහුදුබඩ ගම්මානය තුළ අනෙක් ගම්මානයට සාපේක්ෂව වඩාත් වැඩි දේශපාලන ස්වාධීනත්වයක් දිනා ගැනීමට කාන්තාවන් සමත්ව සිටියහ (හර්ට්ස්,2004 : 265).

නේපාලයේ කාන්තා දේශපාලනය තුළ ක්‍රියාත්මක කෝටා ක්‍රමය පිළිබඳ කළ නිරීක්ෂණ තුළින් පවා පසුගිය වසර 10 තුළ කාන්තාවන්ගේ තත්ත්වය දියුණු කිරීමට එය දායක වූ ආකාරය මනාව පැහැදිලි විය. කාන්තා නියෝජිතවරියන් ගණනාවක් විසින් ප්‍රකාශ කළේ තමන් ඇතැම් අවස්ථාවලදී පිරිමි දේශපාලන නියෝජිතයන්ගේ අඩු සැලකිල්ලට ලක්වුනු බවයි. කෙසේ නමුත් හරි අඩකට වඩා වැඩි සෙසු කාන්තා නියෝජිතයන්ට එවැනි කටුක අත්දැකීම් හිමිව නොතිබිණි. මෙහිදී ද නිරීක්ෂණයන් තුළින් අනාවරණය වූයේ කාන්තා ඡන්ද දායකයන් කාන්තා දේශපාලනඥයන් හමුවේ සිය ගැටලු සාකච්ඡා කිරීමට වැඩි කැමැත්තක් දැක්වූ බවයි. කාන්තා දේශපාලනඥයන් ප්‍රශ්න විසඳනු වස් අනාගත සැලසුම් සැපයීමට නිතරම උත්සාහ කළ අතර පරිසර සංරක්ෂණය, අපද්‍රව්‍ය කළමණාකරණය, ජල කළමණාකරණය, රැකියා සැපයීම ළමා ආරක්ෂණය සහ දුප්පත් කාන්තාවන්ගේ නිවාස අවශ්‍යතා වැනි ප්‍රශ්න සම්බන්ධයෙන් නිතරම අවධානය දක්වමින් කටයුතු කළහ. කෙසේ නමුත් තමන්ට තනියෙන් නැගී සිට යමක් කළ හැකියයි මේ කාන්තාවන් විශ්වාස කරන බවක් පෙනෙන්නට නොතිබිණි. ග්‍රාමීය මට්ටමේදී 50 -60% අතර ප්‍රමාණයක් දක්වාත් නාගරික මට්ටමේ දී 40% දක්වාත් සිය නියෝජන කෝටාවන් ඉහළ දමන ලෙස නේපාල කාන්තා දේශපාලනඥයන් තුළින් ඉල්ලීම් ඉදිරිපත් වන අතර දේශපාලන ආයතන තුළ පිරිමි දේශපානඥයන්ගේ සහයෝගය දිනා ගැනීමට එවැනි බලයක් අවශ්‍ය වේ යැයි ඔවුන් කල්පනා කරයි. (කාන්තා දේශපාලනය පිළිබඳ ආසියා -පැසිපික් මධ්‍යස්ථානය, 2000).

තමන්ට නියෝජන කෝටා ක්‍රමය හරහා පැහැදිලි වාසි අත්ව ඇතැයි පාකිස්ථාන කාන්තාවෝද විශ්වාස කරති. කෝටා ක්‍රමය තුළ ඔවුන්ද ප්‍රශ්නවලට මුහුණ දීතිබිණි. ඇතැම් අවස්ථාවල ඔවුන්ගේ නියෝජනය නොවැදගත් ලෙස සලකන ලද අතර පිරිමි දේශපාලන නියෝජිතයන්ගේ විරෝධාකල්පවලට ගොදුරු වන්නටද ඇතැම් විට ඔවුනට සිදුවිණි. යූනියන් ඒකක විසින් පහළ ඒකකවලට නියෝජිතයන් තෝරාපත් කිරීම නිසා ටෙහ්සිල් සහ දිස්ත්‍රික් පරිපාලන ඒකකවල නියෝජිතයන්ට කිසියම් ඡන්ද කොට්ඨාශයක් පිළිබඳ ඍජු බැඳීමක් ඇති නොවිණි, පාකිස්ථාන ප්‍රාදේශීය දේශපාලන ආයතනවල ක්‍රියාකාරීත්වය සිදුවන්නේ යූනියන් ඒකකවල නියෝජිතයන් විසින් පත් කරනු ලබන කමිටු ක්‍රමයක් හරහා වන අතර බොහෝ විට යූනියන් ඒකකවල සිටින පිරිමි නියෝජිතයන් විසින් පහළ ඒකකවල කාන්තා නියෝජිතයන් කාන්තාවන්ගේ ප්‍රශ්නවලට ඍජුවම අදාළවන කමිටුවලට පමණක් පත් කිරීමට වග බලා ගත්හ (කාන්තා දේශපාලනය පිළිබඳ ආසියා - පැසිපික් මධ්‍යස්ථානය, 2000). කෙසේ නමුත් කාන්තා දේශපාලන නියෝජිතයන් සිය කාර්යය පිළිබඳ දැඩි හැඟීමකින් යුතුව කටයුතු කරනු දැකිය හැකිය. පාකිස්ථානයේ ඉස්ලාමාබාද් හී ක්වාඉද්-ඊ-අසාම් විශ්වවිද්‍යාලයේ කාන්තා අධ්‍යන මධ්‍යස්ථානයේ ප්‍රධානී ෆර්සානා බාරි ප්‍රකාශ පාකිස්ථාන කාන්තා දේශපාලනයේ ප්‍රතිඵල පිළිබඳ කියා සිටින්නේ මෙවැන්නකි, "පාකිස්ථානය තුළ කාන්තාවන් සුවිශාල ප්‍රමාණයක් ක්‍රියාකාරී දේශපාලනයට පිවිසීම නිසා සමාජය තුළ පැහැදිලි වෙනසක් හට ගෙන තිබෙනවා. මිනිසුන්ගේ සමාජ සහ දේශපාලන ජීවිතය තුළ තවමත් තමන්ගේ බලය විහිදුවාගෙන සිටින සම්ප්‍රදායික බල ව්‍යූහය තුළ පැහැදිලි වෙනසක් ඇති කරන්නට කාන්තා දේශපාලනය සමත්ව තිබෙනවා. "යූනියන් ඒකක ප්‍රමාණය අඩු කරන්නට සැලසුම් කරමින් යෝජනා කර ඇති ව්‍යවස්ථා සංශෝධනයට විරුද්ධ වන්නට පාකිස්ථාන කාන්තාවන් මේ වනවිට කටයුතු කරමින් සිටී. ඒ අතරම ඔවුන් තමන්ට හිමි කෝටාව 33 -50% දක්වා ප්‍රමාණයකින් වැඩි කරන

ලෙසත් ඉල්ලීම් කරනු ලබයි. පාකිස්ථානයේ කාන්තා දේශපාලනඥයන්ගේ සහභාගීත්වයෙන් ගොඩනගා තිබෙන කාන්තා නියෝජිත ජාලයේ (Women councillos Network) සාමාජිකාවක වන සුමේරා ගුල් මෙසේ කියා සිටියාය, "පාකිස්ථාන කාන්තාවන් තමන්ගේ අයිතිවාසිකම් අනෙක් අයට ඕනෑ විදිහට කප්පාදු කරන්න දීලා බලා සිටින්න තවදුරටත් සූදානම් නැහැ. රජය අපට සවන් දීල අපේ ඉල්ලීම්වලට සාධාරණය ඉෂ්ටකරන්නේ නැත්නම් දැන් අපිට හැකියාව තිබෙනවා ඕනෑම මොහොතක විරෝධතා කණ්ඩායම් පාරට ගෙනැල්ලා විරෝධතා ව්‍යාපාර හරහා අපේ අයිතීන් දිනා ගන්නට."

බංග්ලාදේශ ප්‍රාදේශීය දේශපාලන ආයතන තුළ කාන්තාවන්ට තුනෙන් එකක නියෝජන කෝටාවක් ලබා දීමෙන් එරට කාන්තා දේශපාලනයට උදා වූයේ පෙර නොවූ විරූ තරමේ යහපත් තත්ත්වයකි. කෙසේ නමුත් විසඳුම් අවශ්‍ය කරන ගැටලු බංග්ලාදේශ කාන්තා දේශපාලනය තුළ තවමත් ඉතිරිව පවතී. ඉහතී කී කෝටාවට කාන්තා නියෝජිතයන් පත්වන ආකාරයෙහි ඇති ගැටලුකාරී බව එහිලා එක් නිදසුනකි. කෝටාව සඳහා කාන්තාවන් පත් වන්නේ ඍජු මැතිවරණයකින් නොවේ, එහිලා සිදුවන්නේ පිරිමි නියෝජිතයන් විසින් නාමකරණයෙන් කාන්තාවන් තෝරා පත් කරලීමයි. මේ තත්ත්වය පත් වන කාන්තා නියෝජිතයන්ට ගෙන එන්නේ තමන් පිරිමි දේශපාලනඥයන් විසින් නිර්මාණය කළ නියෝජිතයන් පිරිසක් පමණක්ය යන හැඟීමයි. හුදෙක් හීනමානයෙන් පමණක් නොව ප්‍රායෝගික තත්ත්වයේදී පිරිමි දේශපානඥයන් විසින් කරන නොසලකා හැරීම්වලටද මේ කාන්තා නියෝජිතයන් නිතරම පාහේ බඳුන් වේ. (කාන්තා දේශපාලනය පිළිබඳ ආසියා -පැසිපික් මධ්‍යස්ථානය, 15). කෙසේ නමුත් නාගරික දිස්ත්‍රික්ක ප්‍රධාන කොටගෙන කාන්තා දේශපාලනය තුළ ඇතිව තිබෙන මේ ප්‍රමාණාත්මක වර්ධනය මහජනතාව තුළ සුබවාදී ආකාල්පමය වර්ධනයක් ඇති කරන්නට සමත්ව ඇත (කාන්තා දේශපාලනය පිළිබඳ ආසියා - පැසිපික් මධ්‍යස්ථානය,

17). කාන්තාවන් විසින්ම ප්‍රකාශ කරන ආකාරයට කාන්තා දේශපාලන නියෝජිතවරියන් සිය අවධානය වඩ වඩාත් යොමු කර ඇත්තේ පවුල් ආරවුල්, දැවැද්දසම්බන්ධ ප්‍රශ්න, කාන්තාවන්ට එරෙහි ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, මාතෘ සහ දාරුක සෞඛ්‍ය, කාන්තා සහ වැඩිහිටි අධ්‍යාපනය, ආදායම් සහ ණය සහන ව්‍යාපෘති, කාන්තා සහයෝගීතා ව්‍යාපෘති සහ අපදා අවස්ථාවන්වල සහන කටයුතු ක්‍රියාත්මක කිරීම ආදී සේවාවන් කෙරෙහිය. මීට අමතරව සිය ඡන්ද කොට්ඨාශය තුළ අයිතිවාසිකම් පිළිබඳ කාන්තාවන් දැනුවත් කිරීමටද මෙකී දේශපාලන නියෝජිතවරියෝ නිරන්තරයෙන්ම කටයුතු කරමින් සිටිති. (කාන්තා දේශපාලනය පිළිබඳ ආසියා -පැසිපික් මධ්‍යස්ථානය, 15 -17).

මේ සියලු කාරණා සලකා බලන විට පැහැදිලිවම පෙනී යනුයේ මිලියන ගණනක් දකුණු ආසියානු කාන්තාවන් ක්‍රියාකාරී දේශපාලනයට පිවිසීම තුළ සැලකිය යුතු, එමෙන්ම වඩාත්ම ගුණාත්මක වෙනසක් ඒ ඒ රටවල ග්‍රාමීය සහ ප්‍රාදේශීය මට්ටමෙන් සිදුව ඇති බවයි. මේ වෙනස ඇතිව තිබෙන්නේ රෝස මල් ඇතිරූ මාවතක් හරහා ගමන් කිරීමෙන් නොව එදා මෙදා තුර සිදුවූ අරගලයන් තුළින්ය. තව ඉදිරියටද කාන්තාවන්ගේ දේශපාලන අයිතීන් උදෙසා මේ කලාපය තුළ අරගල සිදුවනු ඇත. කාන්තාවන්ට දේශපාලනය තුළ කෝටාවක් වෙන් කර දීම සම්බන්ධයෙන් නිරන්තර විරෝධතා ක්‍රියාත්මක වේ. විරෝධතා නගන්නන්ගේ අදහස වනුයේ කාන්තා දේශපාලන කෝටාව තුළින් සැබෑ ලෙසම සිදුවනුයේ පිරිමින්ගේ බලයට යටත්ව පවුල් සංස්ථාව තුළ පිරිමින්ගේ රූකඩ මෙන් කටයුතු කරන කාන්තාවන් දේශපාලන නියෝජනයට පත්වීම පමණක් බවයි. ඒ අනුව මේ හරහා සිදු වනුයේ පිරිමි දේශපාලනඥයන්ගේම තවත් මුහුණුවරක් දේශාපාලනයට පිවිසීම පමණක් බවයි මේ විරෝධතාකරුවන්ගේ අදහස.කෙසේ නමුත් විරෝධාකල්ප දරන්නන් විසින් ගෙන එන මෙම තර්කය පිළිබඳ අප සිතා බැලිය යුත්තේ දකුණු ආසියානු රටවල එන සාම්ප්‍රදායික පවුල් දේශපාලනය පිළිබඳ

අවබෝධයක්ද සහිතවය. පවුල් දේශපාලනය තුළ කාන්තාවන් මෙන්ම පිරිමින්ද හරි හරියට බලයට පත්වේ. කෙසේ වුවත් එසේ පත්වන පිරිමින්ට පවුලේ වැඩිහිටියන්ගෙන් එල්ල වන බලපෑමට වඩා වැඩි බලපෑමක් කාන්තාවන්ට එල්ල වන්නේ යයි පැහැදිලිව ඔප්පු වී නොමැත. කාන්තාවන්ට නියෝජනය සඳහා කෝටාවක් වෙන් කර දීමේ සරලම අදහස වන්නේ එවැනි කෝටාවකින් තොරවම පිරිමින් දේශපාලනය තුළ හිමි කරගෙන තිබෙන තත්ත්වයට සමාන තත්ත්වයක් කාන්තාවන් විෂයෙහිද ඇති කරලීම සහ පිරිමින් විසින් දේශපාලනය තුළ භුක්ති විඳින නිදහස ම කාන්තාවන්ටද උදා කරලීමයි.

05

# ජාතික පාර්ලිමේන්තු තුළ කාන්තා ක්‍රියාකාරීත්වය

මින් පෙර අවස්ථාවකද සඳහන් කළ පරිදි දකුණු ආසියාවේ ඒ ඒ රටවල නිදහසින් පසු දේශපාලනය තුළ කාන්තා සහභාගීත්වය ඉතාම අවම මට්ටමක පැවැතුණු අතර, අවසාන දශක කිහිපය තුළ මේ තත්ත්වයේ කිසියම් වෙනසක් සිදු වූවානම් ඒ ද ඉතා අවම වශයෙනි. පසුගිය වසරවල ඒ ඒ රටවල ජාතික ව්‍යවස්ථාදායකයන් තුළ කාන්තා නියෝජනය සඳහන් වූයේ, නේපාලය තුළ 1999 දී 5.9% ක්, පාකිස්ථානයේ 2002 වර්ෂයේදී 21.1% ක්, 2001 වසරේදී ශ්‍රී ලංකාවේ 4.4% ක්, ඉන්දියාව තුළ 2004 වසරේදී 8.3% සහ බංග්ලාදේශයේ 2001 වසර තුළ 2.0% ක් වශයෙනිඃ "Online Women In Politics," 2005, "Global Database," 2005). ජාතික දේශපාලනය තුළ කාන්තා ක්‍රියාකාරීත්වයෙහි ඇති මෙම ඌනතාවය පිළිබඳ සිය විශේෂ අවධානය යොමු කරන්නට විවිධ කාන්තා සංවිධාන සහ ව්‍යාපාර කටයුතු කළහ. 1980 දශකයෙන් පසු ඉතාම පැහැදිලිව ඉස්මතු වුණ මේ ව්‍යාපාරයන්හි ක්‍රියාකාරීත්වය තුළ ඉහත කී ඌනතාවයන් සමනය කරන්නට විවිධ ක්‍රියාමාර්ග ගනු ලැබුණු අතර ජාතික දේශපාලනය තුළද කාන්තාවන් සඳහා විශේෂ කෝටා ක්‍රමයන් යෝජනා වූයේ ඒ අනුවය.

'ජාතියෝ සංග්ශද්' හෙවත් බංග්ලාදේශ පාර්ලිමේන්තුවේ ආසන සංඛ්‍යාව 345 ක් දක්වා වැඩි කරන්නටත් එයින් ආසන 45 ක් කාන්තා නියෝජනය සඳහා වෙන් කිරීමටත් තමන් බලාපොරොත්තු වන බව බංග්ලාදේශ පාලක සන්ධානය පසුගිය වර්ෂයේදී නිල වශයෙන් ප්‍රකාශ කළහ. ජාතික දේශපාලය

තුළ හුදෙක් 2% ක් පමණක් වන කාන්තා නියෝජනය 13% ක් දක්වා ඉහළ දැමීමට බංග්ලාදේශ ආණ්ඩුවේ මෙම තීරණය සමත්වනු ඇත. කෙසේ නමුත් මේ තීරණය හරහා සැබෑ ලෙසම සිදු වනුයේ මෙතෙක් එරට තුළ ක්‍රියාත්මක වූ කෝටා නීතිය මදක් පුළුල් කිරීම පමණි. මහජන ඡන්දයෙන් තේරී පත්වන නියෝජිතයන්ගේ නාමකරණය පදනම් කරගෙන පාර්ලිමේන්තු ආසන 330 න් 30 ක් කාන්තාවන්ට වෙන් කර දීම එකී කෝටා ක්‍රමය හරහා සිදු වේ. මෙම කෝටා ක්‍රමය බංග්ලාදේශය තුළ ස්ථාපනය කෙරුණේ 1972 ව්‍යවස්ථාවෙන්ය. ආරම්භයේදී මන්ත්‍රී ආසන 15 ක් පමණක් කාන්තාවන්ට හිමිවූ අතර පසුකාලීනම එය 30 ක් දක්වා වැඩි කෙරිණි. බංග්ලාදේශයේ කාන්තාවන් දැන් දැන් පෙළ ගැසෙන්නේ තමන්ට හිමි කෝටාව සඳහා නාමකරණයෙන් නොව මහජන ඡන්දයෙන් තේරී පත්වන්නට අවස්ථාව දෙන්නැයි ඉල්ලා සිටිමින්ය.

සෙසු ඕනෑම ඉස්ලාම් රටක මෙන්ම පාකිස්ථානය තුළද කාන්තාවන් සැලකෙන්නේ දෙවන පන්තියේ පුරවැසියන් ලෙසය. කාන්තාවන් සම්බන්ධයෙන් පාකිස්ථානය තුළ ඇති අවසැලකිල්ල පැහැදිලිවම පෙනෙන්නේ එරට තුළ ක්‍රියාත්මක සාක්ෂි නීතිය පිළිබඳ අවධානය යොමු කිරීමේදීය, ඒ යටතේ පාකිස්ථාන අධිකරණයක් ඉදිරියේ ඕනෑම කාන්තා සාක්ෂිකාරිනියකට හිමිවන්නේ පිරිමි සාක්ෂිකරුවෙකුට හිමිවන පිළිගැනීමෙන් හරි අඩකි. 1983 පෙබරවාරි 12 වනදා ලාහෝර් නගරයේදී කාන්තාවන් පිරිසක් විසින් සිදු කළ මහා පරිමාණ විරෝධතා වැඩසටහනකට එරට රජයේ හමුදා විසින් පහර දුන් අතර සිද්ධියෙන් පසුව පාකිස්ථානය තුළ සෑම වසරකම පෙබරවාරි 12 වනදා සැලකෙනුයේ ජාතික කාන්තා දිනය වශයෙනි. දේශපාලන නියෝජනය සම්බන්ධයෙන් සලකා බැලූ කල්හි අවම කාන්තා නියෝජනයක් සහතික කිරීම සඳහා පමණක් සිය අවධානය යොමු කරන්නට පාකිස්ථානය කටයුතු කළ බව පෙනී යයි. 1954, 1956, 1962, 1970, 1973 සහ 1985 යන වර්ෂවල සම්මත කෙරුණු ඒ ඒ ව්‍යවස්ථාවන්හි කාන්තාවන්

සඳහා ජාතික සහ පළාත් යන මට්ටම්වලදී නියෝජනයක් වෙන් කර දීමට අවශ්‍ය ප්‍රතිපාදන අන්තර්ගත විය. කෙසේ වෙතත් එකී ප්‍රතිපාදන වලින් බොහෝ විට වෙන් කෙරුනේ පහත් දහයත් අතර ආසන ප්‍රමාණයක් වූ අතර ඒ සඳහා නියෝජිතවරියන් තෝරා ගැනුණේ ද මහජන ඡන්දයෙන් නොව සෙසු මන්ත්‍රීවරුන්ගේ නාමකරණයෙනි. කාන්තාවන් සඳහා නිශ්චිත ආසන ප්‍රමාණයක් වෙන් කිරීමේ ක්‍රමවේදය යළි බලගැන්වීම අරමුණු කර ගෙන 1998 දී පැවැත්වුණු ජාතික වැඩසටහනෙන් සහ එරට කාන්තා සහ සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යංශය 2001 වසරේ මැයි මාසයේ දී ගෙන ආ යෝජනාවකින් කාන්තාවන් සඳහා 30% ක් ස්ථාවර නියෝජනයක් ඉල්ලා සිටින ලදි. දේශපාලන පක්ෂ 11 ක් මේ වනවිට මේ යෝජනාව සඳහා සිය සහයෝගය පළ කර ඇත.

පාකිස්තානය තුළ පසුගිය කාලයේ පැවති හමුදා පාලනය කාන්තාවන් සම්බන්ධයෙන් අනුගමනය කළේ යම් ආකාරයක ප්‍රගතිශීලී ප්‍රතිපත්තියක්ය. ඒ අනුව එවකට ජනාධිපති ධූරය දැරූ ජෙනරාල් ෆර්වේෂ් මුශාරෆ් (සමහරවිට තම රජය ලිබරල්වාදීයයි ලොවට පෙන්වන්නට මෙන්) ප්‍රාදේශීය දේශපාලන ආයතන තුළ 33% ක නියෝජනයක් කාන්තාවන්ට වෙන් කරන්නටත්ඒ ප්‍රමාණයෙන් හරි අඩක්, එනම් 17% ක කාන්තා නියෝජනයක් පළාත් සහ ජාතික ව්‍යවස්ථාදායක සභාවන් තුළත් ජාතික පාර්ලිමේන්තුවේ සෙනට් මණ්ඩලය තුළත් ඇති කරන්නට තීරණය කළහ.ඒ අනුව පාකිස්ථාන පාර්ලිමේන්තුවේ ආසන 342 60 ක (හෙවත් 17% ක්) කෝටාවක් කාන්තාවන්ට වෙන් කර දීමට යෝජනා කෙරෙන පාර්ලිමෙන්තු පනතකට 2002 දී ජනාධිපතිවරයාගේ අනුමැතිය හිමි විය. මේ නව කෝටාව අනුව කාන්තාවන්ට හිමිවූ ආසන ප්‍රමාණය ඊට පෙර පැවති ආසන 20 මෙන් තුන් ගුණයක් විය. මෙම කාන්තා කෝටාව මහ මැතිවරණයෙන් ජයග්‍රහණය කරන ඒ ඒ දේශපාලන පක්ෂ අතර සමානුපාතික ක්‍රමයක් අනුව බෙදා හැරිණි. එහෙත් ඒ

තුළ නැවතත් සිදුවන්නේ කාන්තාවන් සෘජු මහජන ඡන්දයෙන් තේරී පත්වීම වෙනුවට නාමකරණයෙන් තෝරා පත් කර ගැනීමය. මැතිවරණයට පෙර ඒ ඒ දේශපාලන පක්ෂ විසින් මැතිවරණ නිලධාරීන් වෙත නම් 60 කින් යුතු නාමයෝජනා ලැයිස්තුවක් ඉදිරිපත් කළ යුතු අතර ඒ ඒ පක්ෂ විසින් කාන්තා කෝටාවෙන් දිනා ගන්නා ආසනවලට ඉහත කී නාමයෝජනා ලැයිස්තුවේ නම් සඳහන් අනුපිළිවෙළට කාන්තාවන් තෝරා පත් කෙරේ. මීට අමතරව පාකිස්ථානයේ පළාත් 06 නියෝජනය වීම සඳහා තවත් 17% ක ආසන ප්‍රමාණයක් ඉහත කෝටාවට එකතු කෙරේ. 2002 වර්ෂයේ පැවැත්වුණු මහ මැතිවරණයෙන් ආසන 342 ක සඳහා තේරී පත්වූ නියෝජිතයන්ගෙන් 72 ක්, එනම් 21.2% ක් කාන්තාවන්ය. ඒ වනාහී දකුණු ආසියානු රටක ජාතික ව්‍යවස්ථාදායකය තුළ දැකිය හැකි ඉහළම කාන්තා නියෝජනයයි.

ජාතික ව්‍යවස්ථාදායකය වන ලෝග් සභාවෙහි නියෝජනය සඳහා කාන්තාවන්ට විශේෂ කෝටාවක් වෙන් කර දෙන්නැයි යන ඉල්ලීම ඉන්දියාව තුළ කලාන්තරයක් තිස්සේම නැගුනකි. නිදහසෙන් පසුව එළැඹුන දශක ගණනාව පුරාම ඉන්දියාව තුළ කාන්තා දේශපාලන නියෝජනය සඳහන් වූයේ 8 -10% අතර ප්‍රමාණයක් වශයෙනි. 1974 දී කාන්තාවන් පිළිබඳ ඉන්දීය කොමිෂමේ 'සමානාත්මතාවය වෙනුවෙන්' යන වාර්තාව නිකුත් වූ විට ඒ විසින් කාන්තා නියෝජනය සඳහා වන කෝටාවක් යෝජනා කර තිබුණේ පංචායත් සභාවන් සඳහා පමණක් වූ අතර ජාතික මට්ටමේ නියෝජනයේදී කාන්තාවන් සඳහා කෝටාවක් වෙන් කිරීමට කොමිෂම විරුද්ධ විය. කෙසේ නමුත් එයින් වසර 10 ක් ගතවූ තැන, ඉන්දීය කාන්තා ක්‍රියාකාරිකයන්ගේ එකමුතුවක් විසින් ඉදිරිපත් කරන ලද 'කාන්තාවන් පිළිබඳ ඉන්දීය ජාතික දැක්ම' නමැති ප්‍රතිපත්තිමය සැලසුම විසින් සියලුම ආකාරයේ දේශපාලන ආයතනයන් තුළ 30% ක කෝටාවක් කාන්තා නියෝජනය සඳහා වෙන් කිරීමට යෝජනා කළහ.

1990 දශකය අගභාගය වන විට කාන්තාවන් පිළිබඳ ඉන්දීය ජාතික දැක්ම බොහෝ දේශපාලන පක්ෂවල පිළිගැනීමට ලක්ව තිබූ අතර කොන්ග්‍රස් පක්ෂය සහ භාරතීය ජනතා පක්ෂයද ඒ අතර විය. මේ පිළිගැනීම හරහා කාන්තාවන් සම්බන්ධයෙන් විශේෂ පනතක් ගෙන ඒමට කටයුතු සූදානම් විය. මෙම පනත ප්‍රථම වතාවට එවකට පැවති ජනතා දාල් නම් පක්ෂයේ ප්‍රධානත්වයෙන් කටයුතු කළ ජාතික පෙරමුණු රජය විසින් යෝජනා කළහ. ආරම්භයේ පටන්ම මෙම පනත් කෙටුම්පත දැඩි සේ ආන්දෝලනාත්මක එකක් වූ අතර පාර්ලිමේන්තුව හමුවට එම පනත ගෙනැවිත් සම්මත කර ගැනීමට උත්සාහ කිරීමේදී පසුකාලීනව පත්වූ රජයන්ට පවා අර්බුදකාරී තත්ත්වයන්ට මුහුණ දෙන්නට සිදු විය. ප්‍රධාන පක්ෂ කිහිපයක ඇතැම් මන්ත්‍රීවරුන්ගේ ද සහයෝගය ලැබූ කුඩා පක්ෂ කිහිපයක් මෙම පනතට විරුද්ධව පාර්ලිමේන්තු විවාදවලදීත් ඉන් පිටතදීත් දැඩි විරෝධයක් එල්ල කළහ. විපක්ෂ කණ්ඩායම්ද මේ විරෝධතාවන්ගේ කොටස් කරුවන් වූහ. විපක්ෂයේ බොහෝ පක්ෂ සමන්විත වූයේ හීන යයි සම්මත කුලවලින් පාර්ලිමේන්තුවට පත්ව ආ එතරම් උගත් නොවූ දේශපාලනඥයන්ගෙන්ය. මෙකී දේශපාලඥයන් දේශපාලනය හරහා බොහෝ වරප්‍රසාද අත්පත් කර ගෙන තිබූ අතර පනතට විරුද්ධ වීමට ඔවුන්ට තිබූ මූලිකම හේතුවවූයේ කාන්තාවන් සඳහා විශේෂ කෝටාවක් වෙන් කිරීම තුළ බ්‍රාහ්මන සහ සෙසු උසස් කුලවල කාන්තාවන් වැඩි වැඩියෙන් දේශපාලනයට පිවිසීමෙන් දැනට තමන්ට හිමි වරප්‍රසාද අහෝසි වනු ඇත යන බියයි. ඒ වනවිටත් පාර්ලිමේන්තුව තුළ කටයුතු කළ කාන්තාවන් සියල්ලම පාහේ උසස් ප්‍රභූ කුලවල කාන්තාවන් වීම නිසා ඔවුන්ගේ මේ බිය සාධාරණ යැයි දිස් වන්නට විය. මේ තත්ත්වය මත කාන්තාවන් සම්බන්ධ යෝජිත විශේෂ පනත පාර්ලිමේන්තුව තුළ නිරන්තරයෙන්ම ගැටුම් ඇතිවීමට මග පෑදීය.

ඉහත කීපනත් කෙටුම්පත කාන්තාවන් සම්බන්ධයෙන් කෝටා ක්‍රමය යෝජනා කළේ වෙනස් වන ඡන්ද කොට්ඨශ ක්‍රමය පදනම් කරගෙනය. සෑම මැතිවරණ

කොට්ඨශ තුනකින් එකක්ම කාන්තාවන් තෝරා පත් කර ගැනීම සඳහා පමණක් වෙන් කෙරෙනු ඇති අතර සෑම වසර 05 කට වරක්ම එය වෙනස් කර සෙසු මැතිවරණ කොට්ඨශ දෙකෙන් එකක් කාන්තාවන් තෝරා පත් කරගන්නා නව ඡන්ද කොට්ඨාශය ලෙස තෝරා ගැනෙනු ඇත. මෙම ක්‍රමවේදය ද කාන්තා ක්‍රියාකාරිනියන්ගේ සහ දේශපාලන ප්‍රතිසංස්කරණ ඉල්ලා සිටි සෙස්සන්ගේ විරෝධතාවයට ලක් විය. කාන්තාවන් සඳහා සෑම මැතිවරණ කොට්ඨශ තුනකින් එකක් පමණක් වෙන් කිරීමෙන් ගම්‍ය වන්නේ පිරිමින් සඳහා ඉතිරි කොට්ඨාශ දෙකම වෙන් කිරීම බව ඔවුන් කියා සිටියහ. එයින් සිදු වන්නේ එක් කොට්ඨාශයකින් තරඟ කරන කාන්තාවන්ට විරුද්ධව සෙසු කොට්ඨාශ දෙකෙහි සිටින කාන්තාවන්ගේ ඡන්දය පිරිමි අපේක්ෂකයන් වෙත යොමු කිරීමයි. මීට අමතරව කාන්තාවන් තේරී පත්වන කොට්ඨාශ සෑම වසර 05 කටම වරක් වෙනස් වීම නිසා පත්වන කාන්තා නියෝජිතයන් සහ ඡන්ද කොට්ඨාශය අතර ස්ථිර සබඳතාවක් ඇතිවීම ද වැලැක්වේ.

මෙම දුර්වලත්වයන් ඉවත් කිරීම සඳහා යෝජනා ගණනාවක්ම ඉදිරිපත් විණි. ඉන් එකක් වූයේ සෑම දේශපාලන පක්ෂයක්ම මැතිවරණයට ඉදිරිපත් කරන අපේක්ෂකයන්ගේ සමස්තයෙන් තුනෙන් එකක් කාන්තාවන් විය යුතු යයි නීති සම්පාදනය කිරීමයි. කාන්තාවන් සඳහා විශේෂ කෝටා ක්‍රමයක් ඉල්ලා සිටි කාන්තා ක්‍රියාකාරිකයන් මෙම යෝජනාවට කිසිසේත් එකඟ නොවූහ. ඔවුන්ගේ අදහස වූයේ මෙම යෝජනාව කාන්තාවන්ගේ කෝටාව තහවුරු කිරීමට ඉවහල් නොවන බවයි. දේශපාලන පක්ෂවලට අවශ්‍යනම් ඉදිරිපත් කරන අපේක්ෂකයන් ගණන සංඛ්‍යාත්මකව වැඩි කිරීමටත් ඒ හරහා සමස්ත අපේක්ෂකයන්ගෙන් තුනෙන් එකක් වන කාන්තා අපේක්ෂිකාවන් ප්‍රමාණය අඩු කළ හැකි බවත්ය. එසේම දේශපාලන පක්ෂවලට අවශ්‍ය නම් ඒ ඒ පක්ෂයට එතරම් වාසි සහගත නොවන ඡන්ද කොට්ඨාශවලට ඉහත කී අපේක්ෂිකාවන් නම් කිරීම හරහා කිසිසේත්ම කාන්තාවන් නියෝජිතයන්

ලෙස පත් නොවන තැනට වගබලා ගත හැකිය. පනත සඳහා මුලින් සහයෝගය දැක්වූ වාමාංශික පක්ෂ ද මෙම වෙනස පනත තුළට ගෙන එනවාට දැඩි සේ විරුද්ධ වූහ. කෙසේ නමුත් 1999 -2000 කාලය තුළ මධූ කිශාවර්, ජයප්‍රකාශ් නාරායන් සහ ශාරාද් ජොශී වැනි ඉන්දීය සමාජයේ ගෞරවනීය පුරවැසියන් විසින් ඉහත කී පනත් කෙටුම්පත සම්මත වීමේ අවශ්‍යතාවය කියා සිටිමින් එයට සිය සහයෝගය පළ කළ අතර එවකට මැතිවරණ කොමසාරිස් K.S. ගිල් ද මෙම පනත් කෙටුම්පත සම්මත වීමේ අවශ්‍යතාවය අවධාරණය කළහ. (නාරායන්, 2000)

යෝජිත පනත් කෙටුම්පත සම්බන්ධයෙන් යෝජනා කෙරුණු තවත් වෙනසක් වූයේ මැතිවරණ කොට්ඨාශ තුනක් (හෝ ඊට වැඩි ගණනක්) ඒකාබද්ධ කොට බහුමන්ත්‍රී මැතිවරණ කොට්ඨාශයක් නිර්මාණය කිරීමයි. එවැනි කොට්ඨාශයක් තුළින් නියෝජිතයන් 03 ක් තෝරා ගත හැකි අතර ඉන් එක් අයෙක් කාන්තාවක් වීම අනිවාර්ය වේ. මේ තුළින් කාන්තාවන්ට විවෘත ඡන්ද කොට්ඨශයක තරග කිරීමට ඉඩ ලැබෙන අතර ඒ තුළ කාන්තා නියෝජිතවරියන් සහ ඡන්ද කොට්ඨාශ අතර බැඳීම ශක්තිමත් වේ. එසේම වරින් වර කිසියම් කොට්ඨාශයක් කාන්තා නියෝජිතයන්ට පමණක් වෙන් කිරීමේ අවශ්‍යතාවද මේ හරහා අවසන් වේ. අඩු වරප්‍රසාදලාභී කණ්ඩායම් සහ කුලහීන යයි සම්මත කණ්ඩායම් වලටද නියෝජනය සහතික කෙරෙන පරිදි මෙම මැතිවරණ කොට්ඨාශ තුළින් සමානුපාතික නියෝජනය පදනම්ව නියෝජිතයන් තෝරා ගන්නා ලෙසද මෙම යෝජනාවෙන්ම ඉල්ලා සිටිනු ලැබිණි.

2003 වර්ෂයේදී එවකට පැවති භාරතීය ජනතා පක්ෂය විසින් කාන්තා නියෝජනය සම්බන්ධයෙන් නව පනතක් යෝජනා කළහ. එම කෙටුම් පතට ඉහත කී අවසාන යෝජනාවේ ඇතැම් අංග අන්තර්ගත වූ අතර ඉන්දීය

පාර්ලිමේන්තුවේ පහළ මන්ත්‍රී මණ්ඩලයේ මන්ත්‍රී ආසන 181 ක් කාන්තාවක් හා පුරුෂයෙක් සම-නියෝජිතයන් ලෙස තෝරා ගැනෙන ද්විත්ව මන්ත්‍රී ආසන ලෙස වෙනස් කිරීමට ඒ හරහා යෝජනා විය. ඒ හරහා මන්ත්‍රී ආසන මුළුමනින්ම කාන්තා නියෝජන ආසන බවට පත් කිරීමක් සිදු නොවන අතර දැනට සිටින පිරිමි නියෝජිතයන්ගේ මන්ත්‍රීධූරවලට කිසිම තර්ජනයක්ද එයින් ඇති නොවේ. නමුත් මේ ක්‍රමය ක්‍රියාත්මක කළහොත් එයින් දැනට තිබෙන කාන්තා නියෝජනයේ ප්‍රතිශතය බරපතල ලෙස අඩු වනු ඇති බව පැහැදිලිවම පෙනුණු අතර එයින් මෙම පනත් කෙටුම්පත පිරිමි පාර්ශවයේ මෙන්ම කාන්තා පාර්ශවයේද බරපතල විරෝධයට ලක් විය. එබැවින් කෙටුම්පත පාර්ලිමේන්තුවේදී ප්‍රතික්ෂේප විණි. 2005 වර්ෂයේ මහ මැතිවරණයෙන් පැහැදිලි ජයග්‍රහණයක් අත්පත් කරගන්නට ඉන්දීය කොන්ග්‍රස් පක්ෂය සමත් වූ අතර කාන්තා නියෝජනය සඳහ විශේෂ කෝටා ක්‍රමයක් සැකසීමේ යෝජනාවන්ට සහයෝගය දැක්වූ සුළු සහ වාමාංශික පක්ෂ ගණනාවක් කොන්ග්‍රස් රජයට සහයෝගය දක්වමින් සිටියි. ඒ සියල්ල එසේ වුවත් කාන්තා නියෝජනය සඳහා කෝටා ක්‍රමයක් පාර්ලිමේන්තු පනතක් මගින් සම්මත කරලීමට කොංග්‍රස් රජය මෙතෙක් සිය අවධානය යොමු කර නොමැත.

06

## කාන්තාවන් සහ පරිපාලන සේවය

දකුණු ආසියානු රටවල රාජ්‍ය පරිපාලන සේවය තුළ දක්නට ලැබෙන අඩු කාන්තා දායකත්වයද සැලකිල්ලට ලක් කළ යුතු කරුණකි.

මේ සම්බන්ධයෙන් අදාළ සංඛ්‍යා දත්ත පහත පරිදි පෙළ ගැස්විය හැක.

පාකිස්ථානය -පාකිස්ථාන ෆෙඩරල්රාජ්‍ය සේවයේ ඉහළම මට්ටම වන 22 ශ්‍රේණියෙහි කිසිඳු කාන්තාවක් සේවයෙහි නියුතු නැත. 21 වන ශ්‍රේණියෙහි සේවයේ නියුතු කාන්තාවන් සංඛ්‍යාව 2 ක් වන අතර එය සමස්ත සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 0.9% කි. 20 වන ශ්‍රේණියෙහි සේවයේ නියුතු කාන්තාවන් ගණන 23 ක් වන අතර එහි ප්‍රතිශතය 2.4% කි. 19 වන ශ්‍රේණිය තුළ කාන්තාවන් 111 ක් සේවය කරන අතර මෙහි ප්‍රතිශතය 5.8% කි. පළාත් රාජ්‍ය සේවයේ ඉහළම ශ්‍රේණි තුළ සේවයෙහි නියුතු කිසිඳු කාන්තාවක් නොමැති අතර පළාත් මට්ටම හෙවත් පහළම මට්ටමෙහි සේවයේ නියුතු  කාන්තාවන් ගණන 07 කි (3.09%). (CAPWIP, 2000 : 13).

නේපාලය - නේපාල රාජ්‍ය සේවයෙහි විශේෂ පංතියෙහි සේවයේ නියුතු කාන්තාවන් ගණන දෙකක් වන අතර එය ප්‍රතිශතයක් ලෙස 2.35% කි. රාජ්‍ය සේවයේ ප්‍රථම පන්තිය තුළ කාන්තාවන් 26 (4.10%) ක් ද දෙවන පංතිය තුළ කාන්තාවන් 86 (3.16%) ක් ද තුන්වන පංතිය තුළ කාන්තාවන් 389 (5.24%) ක් ද ශ්‍රේණිලාභී නොවන කාන්තාවන් 7210 (8.20%) ක් ද සිටියි. ඒ අනුව රාජ්‍ය

සේවය තුළ සමස්ත කාන්තා දායකත්වයෙහි අගය 7713 ක් වන අතර ප්‍රතිශතයක් ලෙස එය මුළු රාජ්‍ය සේවක සංඛ්‍යාවෙන් 7.81% කි. (CAPWIP, 2002 : 20).

බංග්ලාදේශය - බංග්ලාදේශයේ ෆෙඩරල් රාජ්‍ය සේවයෙහි ලේකම්වරියන් 02 (1.7%) ක් ද අතිරේක සහ සම ලේකම්වරියන් 05 (1.80%) ක් ද නියෝජ්‍ය ලේකම්වරියන් 05 (0.74%) ක් ද සේවය කරයි. පළාත් රාජ්‍ය සේවය තුළ කාන්තා ලේකම්වරුන් සේවයේ නිරත නොවේ. එකඳු කාන්තා දිස්ත්‍රික් මහේස්ත්‍රාත්වරයෙකු හෝ බංග්ලාදේශය තුළ නොමැති නමුත් එක් කාන්තා අතිරේක දිස්ත්‍රික් මහේස්ත්‍රාත්වරයෙකු සිටියි. පහළ මටටමේ රාජ්‍ය සේවය තුළ 4-5% අතර කාන්තා දායකත්වයක් දැකිය හැක. (CAPWIP, 2002 : 20).

ශ්‍රී ලංකාව - ශ්‍රී ලංකාවෙහි මධ්‍යම ආණ්ඩුවේ රාජ්‍ය සේවය තුළ අමාත්‍යංශ ලේකම්වරියන් ගණන ප්‍රතිශතයක් ලෙස 2.8% ක් වන අතර අතිරේක ලේකම්වරියන්ගේ ප්‍රතිශතය 17.8% කි. දෙපාර්තමේන්තු වල කාන්තා අතිරේක සහ නියෝජ්‍ය ප්‍රධානයන් සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස පිළිවෙළින් 23.8% ක් සහ 20% ක් වේ. පළාත් සභා මට්ටම තුළ පළාත් ප්‍රධාන ලේකම්වරු වශයෙන් කාන්තාවන් සේවයේ නිරත නැති අතර පළාත් අමාත්‍යංශ ලේකම්වරියන් ගණන ප්‍රතිශතයක් ලෙස 8%ක් වේ. දිස්ත්‍රික් මට්මේදී නාගරික කොමසාරිස්වරියන්ගේ ප්‍රතිශතය 7.1% ක් වන අතර නගර සභාවන්හී නියෝජ්‍ය කොමසාරිස්වරියන්ගේ ප්‍රතිශතය 40.3% ක් ද නගර සභා ලේකම්වරියන්ගේ සහ සහකාර ලේකම්වරියන්ගේ සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස 34% ක් ද වේ. මහ නගර සභාවන්හී ලේකම්වරුන් ලෙස කටයුතු කරන කාන්තාවන් ගණන ප්‍රතිශතයක් වශයෙන් 16.2% ක් වේ. (CAPWIP, 2002 : 17). මේ අනුව සෙසු දකුණු ආසියානු රටවල තත්ත්වයට සාපේක්ෂව වඩාත් වැඩි කාන්තා දායකත්වයක් ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවය තුළින් හඳුනා ගත හැක.

සෑම දකුණු ආසියානු රටකම පාහේ පළාත් රාජ්‍ය සේවයට වඩා වැඩි කාන්තා දායකත්වයක් මධ්‍යම ආණ්ඩුවේ රාජ්‍ය සේවය තුළ හඳුනාගත හැක. ඒ අනුව පළාත් රාජ්‍ය සේවය තුළ වඩාත් සම්ප්‍රදායානුකූල ස්වභාවයක් ක්‍රියාත්මක වනවා විය හැක. මෙම සංඛ්‍යාවන් පිළිබඳ ඉදිරිපත් වන වෙනස් විදිහේ තර්කයක් නම් මේ රටවල ඉහළ පාංතික සහ ප්‍රභූ පවුල්වල කාන්තාවන් සිය තත්ත්වය වඩාත් සමාජගත කර ගැනීමේ මාවතක් ලෙස මධ්‍යම සහ පහළ පාංතික කාන්තාවන් අබිභවමින් රාජ්‍ය සේවයට පිවිස ඇත යන්නයි.

ඉන්දියාවේ මධ්‍යම ආණ්ඩු රාජ්‍ය සේවය තුළ කාන්තා සහභාගීත්වය පිළිබඳ සංඛ්‍යාත්මක දත්ත නොමැත. 1997 වර්ෂයේදී ඉන්දීය රාජ්‍ය සේවයෙහි ජාතික මට්ටමේ සේවයේ නියුතු කාන්තාවන සංඛ්‍යාව ප්‍රතිශතයක් වශයෙන් 10.3% කි. ඉන්දීය පොලිස් සේවය තුළ 1999 වර්ෂය වන විට කාන්තා නිලධාරිනියන් ප්‍රතිශතය 3.5% ක් වූ අතර 1998 වර්ෂයේදී ඉන්දීය විදේශ සේවය තුළ කටයුතු කළ කාන්තාවන්ගේ සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස 11.4% ක් විය.

මෙකී සංඛ්‍යාවන්ගේ ඉතාම සුළු වර්ධනයක් පමණක් පසුගිය වර්ෂ කිහිපය තුළ ඇති වන්නට ඇත. (CAPWIP, 2002 : 17).

මෙම රටවල රාජ්‍ය සේවයෙහි අඩු කාන්තා දායකත්වය දේශපාලන ක්ෂේත්‍රයට පිවිසෙන කාන්තාවන් අධෛර්යමත් කිරීමට හේතුවන්නට ඉඩ ඇත. පරිපාලනය තුළ රාජ්‍ය සේවය ඉතාම වැදගත් භූමිකාවක් නිරූපනය කරන අතර රාජ්‍ය සේවකයන්ට සිය දීර්ඝ කාලීන අත්දැකීම් හරහා දේශපාලනඥයන් අබිභවා කටයුතු කිරීමටද ඉඩ කඩ ඇත. කාන්තා දේශපාලන නියෝජිතවරියන්ට කටයුතු කරන්නට සිදු වනුයේ බහුතරය පිරිමි පාර්ශවය වන රාජ්‍ය සේවක පිරිසක් සමග වන අතර පරිපාලන කටයුතු වලදී ඔවුන්ට සහයෝගය දැක්විය යුතු නිලධාරී තන්ත්‍රය එම තත්ත්වය තුළ වඩාත් සතුරු මුහුණුවරක් ගන්නට ඉඩ ඇත.

# 07

# කාන්තාවන්, නියෝජන කෝටා ක්‍රමය සහ දේශපාලන ගැටලු

මෙම සටහන ආරම්භ කරමින් අපි දකුණු ආසියානු කලාපයේ රටවල් පිළිබඳ උපහාසාත්මක සත්‍යයක් අනාවරණය කළෙමු. ඒ කොතරම් නම් කාන්තා දේශපාලන නායිකාවන් රාජ්‍ය යාන්ත්‍රණයේ ඉහළම තත්ත්වයන්ට පත් වූවත් රාජ්‍යයේ සෙසු අංශවල එනම් පහළ මට්ටමේ දේශපාලන නියෝජනය සහ රාජ්‍ය සේවය තුළ කාන්තා සහභාගීත්වයේ ඇති ඉතා අඩු දායකත්වයයි. මේ හැරුණු කොට මෙකී රටවල දක්නට ඇති තවත් උපහාසාත්මක තත්ත්වයක් නම් මේ රටවල කාන්තවන් විෂයෙහි සමානාත්මතාවය සහ දේශපාලනය තුළ ඔවුන්ගේ නියෝජනය එකිනෙකට සම්පූර්ණයෙන්ම පරස්පර විරෝධී වීමයි. නිදසුනක් ලෙස කලාපයේ සෙසු රටවල කාන්තාවන්ට වඩා වැඩි සමානාත්මතාවයක් භුක්ති විඳින ශ්‍රී ලාංකික කාන්තාවන් ප්‍රාදේශීය දේශපාලනයට ඍජුව සහභාගී වීමෙන් බොහෝ දුරට වැලකී සිටින අතර පාර්ලිමේන්තුව තුළ ඔවුන්ගේ නියෝජනයද සීමා සහිතය. අනෙක් අතට මුස්ලිම් රටක් බැවින් කාන්තාවන් සම්බන්ධයෙන් එතරම් මිත්‍රශීලී නොවන ප්‍රතිපත්තීන්ගෙන් යුක්ත පාකිස්ථානය තුළ ප්‍රාදේශීය දේශපාලන ආයතනවල නියෝජිතයන්ගෙන් තුනෙන් එකක් කාන්තාවන් වන අතර දකුණු ආසියාවේ සෙසු රටවල් සියල්ලම ඉක්මවා ඉහළම අගය වාර්තා කරමින් පාර්ලිමේන්තුවේ 17% ක කාන්තා නියෝජනයකටද එරට හිමිකම් කියයි. මෙම තත්ත්වයට හේතු වී ඇත්තේ කාන්තා නියෝජනය සඳහා ලබා දී ඇති කෝටා ක්‍රමයයි. ඒ අනුව නියෝජනය විෂයෙහි වඩාත් දුර්වල අඩියක සිටි රටවල් පැහැදිලි ඉදිරි පිම්මක් ගෙන ඇත.

කාන්තා නියෝජනය සඳහා විශේෂ කෝටාවක් වෙන් කිරීම තුළ ඒ ඒ රටවල කාන්තාවන්ගේ තත්ත්වය ස්ථාවර ලෙස වෙනස් කරන බවක් මේ දක්වා පැහැදිලිව අනාවරණය වී නොමැත. නිදසුනක් ලෙස ප්‍රබල කාන්තා දේශපාලන නියෝජනයක් සහිත වුවද පාකිස්ථානය තුළ ඉස්ලාම් මූලධර්මවාදී ෂියා උල්හක්ගේ යුගයේ සම්මත කෙරුණු කාන්තාව විෂයෙහි සමානාත්මතාවය ප්‍රතික්ෂේප කරන ආකාරයේ නීති-රීති තවමත් එලෙසම ක්‍රියාත්මක වේ. මෙහිලා නිදසුන් ලෙස එරට සාක්ෂි නීතිය, ශාරීරික හානි පැමිණවීම් සහ මරණය සිදු කිරීමේ අපරාධ වරද සම්බන්ධයෙන් වන සම්මුතීන් සහ වන්දි නිර්වචනය කරන ක්විසාස් සහ දියාත් පනත්, සහ කාන්තාවන් විසින් සිදුකරන දේපළ සොරකම සහ මත්පැන් පානය ආදී තහනම් ක්‍රියා සම්බන්ධයෙන් වන ශරියා නීතිය දක්වන හුදූද් ආඥා පනත සඳහන් කළ හැක. එපමණක් නොව වැඩිහිටිභාවය නිර්වචනය කරන පාකිස්ථාන නීතින්ද ගැහැණු දරුවන් සහ පිරිමි දරුවන්ගේ වැඩිහිටිභාවය නිර්වචනය කරනුයේ එකිනෙකට බොහෝ සෙයින් වෙනස් ආකාරයටය. නීතිය කඩ කිරීමේ සිදුවීම් සම්බන්ධයෙන් දඬුවම් පැමිණවීමේදීද ගැහැණුන් සම්බන්ධයෙන් වඩාත් දරුණු දඬුවම් නියම කර ඇත. බන්ධනාගාරගතව සිටින පාකිස්ථාන කාන්තාවන්ගෙන් අති බහුතරයකට දඬුවම් නියමව ඇත්තේ හුදූද් ආඥා පනත ප්‍රකාරවය.

ඒ අනුව දකුණු ආසියාව තුළ කාන්තාවට හිමි සමස්ත තත්ත්වය තවමත් ප්‍රශ්නාකරීය.

මේ තත්ත්වයට විසඳුමක් ලෙස ඒ ඒ රටවල් විසින් කාන්තාවන් සඳහා විශේෂ නියෝජන කෝටා ක්‍රමයක් වෙන් කිරීම විවිධ අවස්ථාවල විවිධ ආකාරයෙන් අත්හදා බලා තිබේ. අප පෙර අවස්ථාවකදීද සඳහන් කළ ආකාරයට මෙම කෝටා ක්‍රමය යම් යම් ප්‍රතිපල උදා කර දී ඇත. අනෙක් අතට එකී කෝටා ක්‍රම බොහෝ අවස්ථාවල බලවත් විරෝධයකට ද ලක්ව ඇත.

කෝටා ක්‍රමයකට නිරන්තරයෙන්ම පාහේ නැගෙන විරෝධය වන්නේ ප්‍රතිරූප මූලික කරගත් දේශපාලනය කාන්තාවන් මත පැටවීමට එය රුකුලක් වනවාය යන්නයි. එවැන්නක් තුලින් සිදු වන්නේ ප්‍රසිද්ධ සහ ප්‍රබල දේශපාලනඥයන්ගේ දියණිවරුන් සහ බිරින්දෑවරුන්ට දේශපාලනයට පිවිසීමට අවස්ථාව ලබා දීම පමණක්ය යන්න විරෝධතාකරුවන්ගේ අදහසයි. සෘජු ක්‍රියාකාරී දේශපාලනයට සම්බන්ධ වී සිටින කාන්තාවන් අති බහුතරයක් එසේ සම්බන්ධ වී සිටින්නේ සිය ප්‍රතිරූපය සඳහා පමණක්ය යන්න සත්‍යකි. කෙසේ නමුත් දකුණු ආසියානු කලාපය තුළ ප්‍රතිරූපය සඳහා දේශපාලනය කිරීම යනු හුදෙක් කාන්තාවන්ට පමණක් නොව පිරිමි පාර්ශවයටද ඇතුළත්ව සම්පූර්ණයෙන්ම පොදු දෙයකි. අමතක නොකළ යුතු කාරණාව වනුයේ ඉහළ ප්‍රභූ පාන්තික කාන්තාවන්ට විශේෂ කෝටා ක්‍රමයකින් තොරව වුවද දේශපාලනයට පිවිසීමට හැකියාව ඇති බවය. ඔවුන් අයත්වන පවුල්වල පිරිමින් විසින් දිගු කාලයක් තිස්සේ දිනා ගත් දේශපාලන පෞර්ෂයම ඔවුන්ගේ ජයග්‍රහණයට පදනම දමනු ඇත. එහෙත් කෝටා ක්‍රමයකින් තොරව දේශපාලන නියෝජනය පහළ මට්ටම් දක්වා කිසිසේත්ම පුළුල් නොවනු ඇත. පහළ මට්ටම තුළ පිරිමින් දේශපාලන බලය සඳහා දිවිහිමියෙන් සටන් වදින අතරතුර ගැහැණුන් නිවෙස්වලට වී කාලය ගත කරනු ඇත.

33% ක කෝටාවක් කාන්තා දේශපාලන නියෝජනය සඳහා වෙන් කර දුන් වහාම ප්‍රබල දේශපාලනඥයන්ගේ දූවරුන් සහ බිරින්දෑවරුන්ද වහ වහා දේශපාලනයට පිවිසෙනු ඇත. නමුත් සියලුම කාන්තා නියෝජිතයන් එකී ප්‍රභූ පන්තියෙන්ම තේරී පත්වීම කිසිසේත්ම සිදු නොවිය හැකිවාක් මෙන්ම කාන්තා නියෝජිතයන් බහුතරය එකී ප්‍රභූ පන්තිය නියෝජනය කරන්නන් නොවීමට ද බොහෝ සෙයින් ඉඩ ඇත. ප්‍රභූ කාන්තාවන් දේශපාලනයට පිවිසීම කෝටා ක්‍රමයේ ප්‍රතිඵලයක් නොවේ. දකුණු ආසියාව තුළ සෑම කලෙකම පාහේ පවුල් පසුබිම පදනම් කරගනිමින් දේශපාලනයට පිවිසි

කාන්තාවන් දැකිය හැකි විය. ඔවුන්ට දේශපාලනය යනු පවුලේ උරුමයකි. දේශපාලන උරුමයක් වූ පමණින් එකී කාන්තාවන් දේශපාලනයට පැමිණීම සම්බන්ධයෙන් විරුද්ධ විය නොහැක්කේ එය ඔවුන් සතු අයිතියක් නිසාවෙනි.

ජාතික මට්ටමේදී ඉහත කී ප්‍රභූ දේශපාලන පවුල්වල සාමාජිකාවන් තමන් ඉතා හොඳ දේශපාලනඥයින් යැයි නොයෙක් වර ඔප්පු කර ඇති අතර, කිසිවෙකුත් දේශපාලනය සඳහා ඔවුන්ගේ සුදුසුකම් ප්‍රශ්න කරන්නේ නැත. කෙසේ නමුත් අධ්‍යනයන්ගෙන් හෙළිවී ඇත්තේ පහළ මට්ටම්වලදී නම් කාන්තා දේශපාලය කාන්තාවන් පිළිබඳ ඇති සාම්ප්‍රදායික චිත්‍රයෙන් ඔබ්බට නොයන බවයි. ඒ අනුව පහළ මට්ටම්වල කාන්තා දේශපාලනඥයන් දේශපාලන ප්‍රශ්න පිළිබඳ ඉතා අඩු අවබෝධයකින් කටයුතු කරනු දැකිය හැක. කෝටා ක්‍රමයක් හරහා කාන්තාවන් විශාල වශයෙන් දේශපාලනයට ඍජු ලෙස සම්බන්ධ කර ගැනීම තුළ මෙම තත්ත්වය සුබදායී ලෙස වෙනස් වනු දැකිය හැක. කාන්තා දේශපාලන නියෝජනය සඳහා කෝටා ක්‍රමයක ඇති වැදගත්කම මතු වෙන්නේ ඒ තුළය.

කිසියම් ආකාරයක කෝටා ක්‍රමයක් නොමැතිව කාන්තා දේශපාලන සහභාගීත්වය ක්‍රමානුකූල වර්ධනයකට ලක් කිරීම කළ නොහැක්කක් බව පැහැදිලිය. යටත් විජිත ඉන්දියාව තුළ (පාකිස්ථානය, බංග්ලාදේශය සහ ඉන්දියාව එක් රටක්ව පැවතුණු සමයේ) මෙම කෝටා ක්‍රමය ක්‍රියාත්මක වූයේ හීනයයි සම්මත කුලවල ජනතාව මුළුමනින්ම නොසලකා හරිමින්ය. ඒ අනුව සේවා වෘතීන්, අධ්‍යාපන ආයතන සහ දේශපාලනය උසස් කුල සහ ගෝත්‍ර සඳහා පමණක් වෙන්කර දෙනු ලැබිණි. පෙර සඳහන් කළ ආකාරයට කෝටා ක්‍රමයක් තුළින් ප්‍රභූ කාන්තාවන්ට සිය ප්‍රතිරූපය ගොඩනගා ගැනීම සඳහා විශේෂ අවස්ථාවන් ලබා නොදෙන අතර ඒ වෙනුවට සියලුම මට්ටම්වල කාන්තාවන්ට දේශපාලන ඉඩකඩ විවර කර දීමක් එයින් සිදු වේ. එවැනි

කෝටා ක්‍රමයක් ජාතික මට්ටමෙන් ක්‍රියාත්මක කිරීම තුළ දේශපාලන ක්‍රියාවලිය සම්පූර්ණ විපර්යාසයකට භාජනය වී ඒ හරහා දූෂණයෙන් තොර දේශපාලනයක් ප්‍රාතිහාර්යයක් ලෙසින් ජනිත වීමක් සිදු නොවනු ඇත. එසේම කෝටා ක්‍රමයක් විසින් සියලුම සම්ප්‍රදායික බාධා විනිර්මුක්ත කර කාන්තාව විෂයෙහි සමානාත්මතාවය උදා කිරීමත් කාන්තාවන්ගේ හැකියාවන් සංවර්ධනය කිරීමත් නොකරනු ඇත. නමුත් අධ්‍යනයන් මගින් පෙන්වා දෙනුයේ කාන්තා නියෝජනය සඳහා විශේෂ කෝටාවක් ලබා දීම යනු කාන්තා නිදහස සඳහා වන අරගලයේ එක් මූලික අවශ්‍යතාවයක් බවය. කෝටාව හරහා අවස්ථාව හිමිවන්නේ උසස් පාන්තික ප්‍රභූ කාන්තාවන්ට වීමට බොහෝ සේ ඉඩ ඇතුවාක් මෙන්ම එකී නියෝජිතවරියෝ කාන්තාවන්ට බලපාන සාමාන්‍ය ප්‍රශ්න පිළිබඳ කවර හෝ හැඟීමකින් තොරව කටයුතු කිරීමටද බොහෝ සේ ඉඩ ඇත. නමුත් ඔවුන් සෙසු කාන්තාවන් සඳහා දේශපාලන ආදර්ශයන් සැපයීමත්, දේශපාලනයේ කාන්තා සහභාගීත්වය සඳහා දොරටු විවර කිරීමත් නිරුත්සාහීවම සිදු කරනු ඇත. දකුණු ආසියානු රටවල කාන්තා ක්‍රියාකාරිකයන් විසින් කාන්තා දේශපාලන නියෝජනය සඳහා විශේෂ කෝටාවක් ඉල්ලා සටන් කරනුයේ එකී බලාපොරොත්තුව සිත් දරාගෙනය.

කෙසේ නමුත් කෝටා ක්‍රමයක් ඇති කර ඒ හරහා නියෝජනය සඳහා කාන්තාවන් තෝරා ගන්නා ආකාරයද වැදගත්ය. පාකිස්ථානයේ සහ බංග්ලාදේශයේ ක්‍රියාත්මක ආකාරයට නාමකරණයෙන් කාන්තාවන් මන්ත්‍රී ආසන සඳහා තෝරා පත් කර ගන්නේ නම් එයින් ප්‍රයෝජනයක් නොමැත. එවැන්නකින් සිදු වන්නේ එකී නියෝජිතවරියන් තමන් තෝරා පත් කරන ලද දේශපාලනඥයන්ට වැඩි සැලකිලි දක්වන්නටත් තමන් විසින් සේවය කළ යුතු සිය ඡන්ද කොට්ඨාශය අමතක කරලන්නටත් කටයුතු කරනු ඇත. ඒ නිසාවෙන් කාන්තාවන්ට කෝටා ක්‍රමයක් ලබා දී ඉන් නොනැවතී සෘජු

මහජන ඡන්දයෙන් එකී කෝටාවන්ට නියෝජිතවරියන් තෝරා පත් කර ගන්නට ඉඩ දෙන්නැයි කාන්තා ක්‍රියාකාරිකයන් විසින්කරන නිරන්නතර ඉල්ලීමට ඉහළ ප්‍රජාතාන්ත්‍රික වටිනාකමක් ඇති අතර එය වඩා අත්‍යවශ්‍ය ඉදිරි ප්‍රතිසංස්කරණයක්ද වේ.

එසේම, වරින් වර වෙනස්වන ඡන්ද කොට්ඨාශයක් පදනම් කර ගනිමින් කෝටාවක් තුළට කාන්තාවන් තෝරා පත් කරගැනීමේ ඉන්දීය ක්‍රමයද විවේචනයට ලක්ව ඇත. ඒ සම්බන්ධයෙන් වෙනස්කම් කිහිපයක්ම යෝජනා වී ඇති අතර නිශ්චිත කාන්තා අපේක්ෂකයන් ප්‍රමාණයක් මැතිවරණ සඳහා නාම යෝජනා කරන්නට දේශපාලන පක්ෂ පොළඹවන නීති ගෙන ඒම හෝ බහුමන්ත්‍රී මැතිවරණ ආසන ක්‍රමය ක්‍රියාත්මක කිරීම එහිලා වඩාත් හොඳ ප්‍රජාතන්ත්‍රවාදී විකල්පයන් සේ පෙනේ. ඊට අමතරව සමානුපාතික නියෝජනය පදනම් කරගත් මැතිවරණ ක්‍රමයක් කරා යොමු වීමෙන් පොදුවේ සුළුතර කණ්ඩායම්වලටත් විශේෂයෙන් කාන්තාවන්ටත් නියෝජනය සඳහා වැඩි අවස්ථා ලැබෙන ඇත.

කාන්තාවන් රාජ්‍ය පාලනය විෂයෙහි වැඩි වැඩියෙන් දායක කර ගැනීමේ අවශ්‍යතාවය සම්බන්ධයෙන් දකුණු ආසියානු රටවල් බරපතල ලෙස සිය අවධානය යොමු කර ඇති බව පොදුවේ සඳහන් කළ හැක. එහිලා අනුගමනය කර ඇති ප්‍රධානතම පියවර වනුයේ කාන්තා දේශපාලන නියෝජනය පිණිස විශේෂ කෝටාවක් වෙන් කිරීම සහ කාන්තා දේශපාලනඥයන් සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන් සහ නම්නීකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමයි. පොදුවේ ගත් කළ ඉහත පියවරවල ප්‍රතිපල යහපත් බව කිව හැක. බරපතල ප්‍රශ්න කිහිපයක් තවමත් ඉතිරිව ඇත. නමුත් ඉදිරි පියවරයන් අනුගමනය කිරීමෙන් පසු සහ කාන්තා ක්‍රියාකාරී සංවිධාන දිගින් දිගටම කැපවීමෙන් පසු ඉතිරිව ඇති එම ප්‍රශ්න කිහිපයද විසඳා ගැනීමට හැකිවෙනු ඇත.

පිටු සැකසුම සහ මුද්‍රණය : සුපුන් 077 2361960